සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

# කාර්ය සාධන වාර්තාව - 2017

1 වන මහල

සෙත්සිරිපාය අදියර II

බත්තරමුල්ල

දුරකථන : 011 2 887 349 - 51

විද්‍යුත් තැපැල : msesecretary@sltnet.lk

# පටුන


| | | |
|---|---|---|
| දැක්ම සහ මෙහෙවර | | iv |
| අමාත්‍යාංශයේ කාර්යයන් | | v |
| අමාත්‍යාංශය යටතේ ඇති අංශ, ව්‍යවස්ථාපිත ආයතන හා දෙපාර්තමේන්තු | | vi |
| අමාත්‍යාංශයේ සංවිධාන සටහන | | vii |
| හැඳින්වීම | | viii - ix |
| භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2017.01.01 සිට 2017.12.31 දක්වා | | |
| 01 | අමාත්‍යාංශයේ පරිපාලන, මූල්‍ය කළමනාකරණ, සැලසුම් හා මෙහෙයුම් කටයුතු | 1 – 10 |
| 02 | උපදේශන අංශය | 11 - 18 |
| 03 | ග්‍රාම සංවර්ධන, අභ්‍යාස හා පර්යේෂණ ආයතනය | 19 - 23 |
| 04 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 24 - 35 |
| 05 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 36 - 44 |
| 06 | ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය | 45 - 50 |
| 07 | වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය | 51 - 60 |
| 07 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 61 - 70 |
| 09 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 71 - 77 |

# දැක්ම

**වසර 2030 වන විට, දිළිඳු බවින් තොර, අයිතිවාසිකම් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහි කරමින් දකුණු හා අග්නිදිග ආසියාවේ වඩාත් ගෞරවයට පාත්‍ර වූ ආදර්ශතම අමාත්‍යාංශය බවට පත්වීම.**

# මෙහෙවර

**ආන්තීකරණයට ලක් වූ හා අවාසි සහගත තත්ත්වයන්හි වෙසෙන ජනතාවගේ (දිළිඳු බවින් පෙළෙන්නන්, වැඩිහිටියන්, ආබාධ සහිත තැනැත්තන්, තනි මා පිය පවුල්, මතට ඇබ්බැහිවූවන් හා අනාථභාවයට පත්වූවන්ගේ) ජීවිතයේ ගුණාත්මක භාවය නංවනු වස්, ආයතනයන්, සේවා ජාලයන් හා වෘත්තිකයන් හරහා ප්‍රබලවූත්, කාර්යක්ෂමවූත්, වේගවත් හා ඵලදායීවූත් ජනහිතකාමී සමාජීය හා ආර්ථිකමය සේවාවන් සලසනු පිණිස දේශීය හා ගෝලීය නියෝජිතායතනයන් සමඟ එක්ව, නිර්මාණාත්මක හා නවෝත්පාදනාත්මක ක්‍රමවේද ඔස්සේ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල උත්පාදනය කිරීම.**

# අමාත්‍යාංශයේ කාර්යයන්

## (2015.09.21 අංක1933/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රය හා 2017.06.09 දින අංක 2022/24 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට 2022 අනුව)

**සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන විෂයයන්ට සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ඇගයීම.**


- ✓ ග්‍රාමීය ජන දිවිය සවිබල ගැන්වීම පිණිස ක්‍රමෝපායන් හඳුන්වාදීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට මූලාධාර සම්පාදනය කිරීම.
- ✓ ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- ✓ ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ දිවිනැගුම (සමෘද්ධි) වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ✓ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ දුබලතාවන් හඳුනා ගැනීම හා පුනරුත්ථාපනය සිදුකිරීම.
- ✓ මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- ✓ ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලිසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම.
- ✓ පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- ✓ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම.
- ✓ ආබාධිතයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ✓ වයෝවෘද්ධ තැනැත්තන් රැක බලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම.
- ✓ කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය.

# අමාත්‍යාංශය යටතේ ඇති අංශ, ව්‍යවස්ථාපිත ආයතන හා දෙපාර්තමේන්තු

1. පාලන අංශය
2. ගිණුම් අංශය
3. අභ්‍යන්තර විගණන අංශය
4. පර්යේෂණ, සංඛ්‍යාලේඛන හා සැලසුම් අංශය
5. මානව සම්පත් සංවර්ධන, කන්ද උඩරට උරුමය හා විශේෂ ව්‍යාපෘති අංශය
6. උපදේශන අංශය
7. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
8. සමාජ සේවා දෙපාර්තමේන්තුව
9. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
10. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය
11. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය
12. ජාතික සමාජ සංවර්ධන ආයතනය
13. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## සංවිධාන සටහන

### සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය




- අ.ජ.(සම‍a.)- අධ්‍යක්ෂ ජනරාල් (සමෘද්ධි)
- අ.ජ.(NISD)-අධ්‍යක්ෂ ජනරාල් (ජාතික සමාජ සංවර්ධන ආයතනය)
- ජ්‍යෙ. ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
- ප්‍ර.ග - ප්‍රධාන ගණකාධිකාරී
- අ.(සැ)-අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
- අ.(සං)-අධ්‍යක්ෂ (සංවර්ධන)
- අ.(උප)-අධ්‍යක්ෂ (උපදේශන)
- අ.(NSPD)-ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය
- අ.(RDTRI)-ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
- අ.(වි.ව්‍යා.)-අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති)
- ස.ලේ. - සහකාර ලේකම්
- ප්‍ර.අ.වි. - ප්‍රධාන අභ්‍යන්තර විගණක
- අ.අ.ජ.(සම‍a.)-අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සමෘද්ධි)
- අ.අ.ජ.(NISD)-අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ජාතික සමාජ සංවර්ධන ආයතනය)
- අ.(මා.ස. සං.හා ක.උ.උ.)-අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන හා කන්ද උඩරට උරුමය)
- අ.(පර්.හා සං.)-අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංඛ්‍යා ලේඛන)
- අ.(ග්‍රා.සං.)-අධ්‍යක්ෂ (ග්‍රාමීය සංවර්ධන)
- අ.(DSS)-අධ්‍යක්ෂ (සමාජ සේවා දෙපාර්තමේන්තුව)
- අ.(NSE)-අධ්‍යක්ෂ (ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය)
- සාමා.(SSB)-සාමාන්‍යාධිකාරී (ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය)
- ස.අ. - සහකාර අධ්‍යක්ෂ
- අ.කා. ම. - අනෙකුත් කාර්ය මණ්ඩලය
- අ.කා. ම. - අනෙකුත් කාර්ය මණ්ඩලය

# හැඳින්වීම

2015.09.21 දින නිකුත් කරන ලද අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රය හා අංක 2022/34 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය පිහිටුවන ලදී. ආන්තීකරණයට ලක්වූ හා අවාසි සහගත තත්ත්වයන්හි වෙසෙන ජනතාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය නැංවීම පිණිස කාර්යක්ෂම හා ඵලදායී මෙන්ම ජනහිතකාමී සමාජීය හා ආර්ථිකමය සේවාවන් සැපයීමේ මෙහෙවර පෙරදැරිව මෙම අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ.

වසර 2030 වන විට, දිළිඳු බවින් තොර, අයිතිවාසිකම් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් දැක්ම යටතේ ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම් 04 ක් මුලික කර ගනිමින් මෙම අමාත්‍යාංශයේ සේවා සම්පාදන ක්‍රියාවලිය සකස් වී ඇත. මෙලෙස සේවා ලබන ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම් වන්නේ,

- ආබාධ සහිත පුද්ගලයින් (මුළු ජනගහනයෙන් 8.7%)
- වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් (මුළු ජනගහනයෙන් 12.4%)
- තනි මාපිය පවුල් (මුළු ජනගහනයෙන් 11.8%)
- අඩු ආදායම්ලාභී පවුල් (මුළු ජනගහනයෙන් 6.7%) කි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව දිළිඳු බව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා ශක්තිය සපයන ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස හැඳින්විය හැකිය.

ආබාධ සහිත තැනැත්තන්ගේ වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම හා ඔවුන් මානසික වශයෙන් බල ගැන්වූ පුරවැසියන් බවට පත් කිරීම, විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ සංවර්ධනය සඳහා පූර්ව මැදිහත් වීම ඇතුළු සමාජ සංවර්ධන අරමුණු පෙරදැරිව සමාජ සේවා දෙපාර්තමේන්තුව සිය කාර්යයන් මෙහෙයවීම සිදු කරයි.

එසේම ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුබසාධනය ඇතුළු සහන සැලසීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය සතු මූලික කාර්යභාරය වේ.

මනෝ විද්‍යාත්මක ක්‍රමවේද මඟින් පුද්ගල පෞරුෂ සංවර්ධනය, අසමතුලිත මානසික තත්ත්වයන් වැළැක්වීම, ආයතන සම්බන්ධීකරණය, නායකත්වය ලබාදීම, දැනුවත් කිරීම හා උපදේශන අවශ්‍යතා සැපයීම මඟින් මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම උපදේශන අංශය මඟින් සිදුකරනු ලැබේ.

කලත්‍රයා දිවියෙන් සමුගැනීම හේතු කොට ගෙන ද, දරුවන් හා කලත්‍රයා අතහැර දැමීම හේතු කොට ගෙන ද තනි මාපියන් බවට පත් වන දිළිඳු ශ්‍රී ලාංකීය පුරවැසියන් හට ඔවුන් මුහුණ දෙන ආර්ථික, සාමාජීය සහ මානසික අපහසුතාවයන් සඳහා යම් පිටුවහලක් වෙමින් එම පවුල් මෙම සමාජ තලයේ ඔවුන්ට හිමි ස්ථානය වෙත ඔසවා තබන්නට අත්වැලක් සැපයීම තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගිත්වය හා අභිමානය ඇති කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් තුළින් ඔවුන්ව උනන්දු කරලීම සහ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ලබා දීමට අවශ්‍ය දායකත්වය සපයනු ලබන්නේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසිනි.

සමාජ වැඩ විෂය මූලික කරගනිමින් රටට අවශ්‍ය සමාජ වැඩ හා සමාජ සුබසාධන වෘත්තිකයන් බිහිකිරීම උදෙසා සමාජ වැඩ පිළිබඳ අධ්‍යාපනය ලබාදෙන ප්‍රමුඛතම ආයතනය වන්නේ ජාතික සමාජ සංවර්ධන ආයතනයයි.

තව ද ප්‍රජාව සවිබල ගන්වා තිරසාර ග්‍රාම සංවර්ධනයක් උදෙසා ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබාදීමේ දිගුකාලීන අත්දැකීම් සහිත ආයතනයක් ලෙස ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය සිය කාර්යභාරය ඉටුකරනු ලබමින් සිටී.

රජයේ විශ්‍රාම වැටුප් නොලබන ස්වයං රැකියාවල නියුක්තවූවන්, වැඩිහිටි පුද්ගලයින්, අවාසි සහගත පුද්ගලයින්, තනි මාපියන්, විදේශ සේවා නියුක්තිකයින්, කලාකරුවන් ආදී සෑම සේවා නියුක්තිකයෙකුම වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයයි.

කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් මානව සම්පත ඵලදායී ලෙස සේවයේ යොදා ගැනීමට අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මානව සම්පත් සංවර්ධන, කන්ද උඩරට උරුමය හා විශේෂ ව්‍යාපෘති අංශය මඟින් සිදුකරයි.

මේ අයුරින් සමාජයේ ජීවත්වන දිළිඳු පුද්ගලයින්, වැඩිහිටියන්, තනි මාපිය පවුල්, මතට ඇබ්බැහිවූවන් හා අනාථභාවයට ලක්වූවන් සඳහා සමාජයීය හා ආර්ථිකමය වශයෙන් සක්‍රීය දායකත්වයක් මෙම අමාත්‍යාංශය මඟින් සපයයි. ඒ අනුව රටේ සංවර්ධනයට දායකවන අමාත්‍යාංශයක් වශයෙන් මෙම අමාත්‍යාංශයට අයත් ආයතන, දෙපාර්තමේන්තු, අංශ මඟින් ක්‍රියාත්මක කළ වැඩසටහන්හි 2017 වර්ෂය තුළ අත් කර ගන්නා ලද ප්‍රගතිය මෙම කාර්යසාධන වාර්තාව තුළ අන්තර්ගත වී ඇත.

01

# පාලන, සංවර්ධන, මානව සම්පත් සංවර්ධන, කන්ද උඩරට උරුමය හා විශේෂ ව්‍යාපෘති, ගිණුම්, අභ්‍යන්තර විගණන, පර්යේෂණ, සංඛ්‍යාලේඛන හා සැලසුම් අංශ



# 01. පාලන, සංවර්ධන, මානව සම්පත් සංවර්ධන, කන්ද උඩරට උරුමය හා විශේෂ ව්‍යාපෘති, ගිණුම්, අභ්‍යන්තර විගණන, පර්යේෂණ, සංඛ්‍යාලේඛන හා සැලසුම් අංශ

.

## 1. අමාත්‍ය මණ්ඩල තීරණ

| | කාරණය | තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
|---|---|---|
| 01 | සමාජ සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන සමාජ සුබසාධන අධිකාරී තනතුරෙහි වැඩ බලන ඩබ්. ඩබ්. රාජපක්ෂ මහතා හා ඩබ්. ඩබ්. අමරතිලක බංඩා මහතා එම තනතුරේ ස්ථිර කිරීම. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කරමින් පවතී. |
| 02 | සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ උපදේශන සහකාර හා සංවර්ධන සහකාර (උපදේශන) තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 03 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා කාර්ය මණ්ඩල අනුමත කරවා ගැනීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 04 | දේශපාලන පලිගැනීම්වලට ලක්වූවන් සඳහා සහන සැලසීම (එච්. කුමාරි නවරත්න මහත්මිය විශ්‍රාම ගැන්වීම). | ක්‍රියාත්මක කර ඇත. |
| 05 | වාර්ෂික වාර්තාව - 2015<br>වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව | ක්‍රියාත්මක කර ඇත. |
| 06 | අතිරේක ලේකම් (පර්යේෂණ හා සංඛ්‍යාලේඛන) තනතුර ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයට ලබා දීම හා එම තනතුර සඳහා ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්.සී.කේ.ධම්මිකා ලියනගේ මහත්මිය පත් කිරීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 07 | දිළිඳුකම පිටුදැකීම පිළිබඳ BIMSTEC අමාත්‍ය සමුළුව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුල පැවැත්වීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 08 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා කාර්ය මණ්ඩල අනුමත කරවා ගැනීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 09 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| 10 | සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය සඳහා නව ගැසට් නිවේදනය අනුව එකතු වූ කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ අධිකාරියක් පිහිටුවීම හා අමාත්‍යාංශ උප කාර්යාලයක් පිහිටුවීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 11 | සංඥා භාෂා පනත් කෙටුම්පත | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. |
| 12 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා ඩබ්.පී.පී. යසරත්න මහතා පත් කිරීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 13 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සුනිල් ජයන්ත නවරත්න මහතා පත්කිරීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 14 | රාජ්‍ය සේවයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට හා කාර්යාල සේවක සේවයට අයදුම්කරුවන් වැඩියෙන් බඳවා ගැනීම. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ක්‍රියා කරනු ලැබේ. |
| 15 | ජනගහන හා සංවර්ධන පිළිබඳ ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආසියානු සංසදයේ (AFPPD) 12 වන සමුළුව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ පැවැත්වීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 16 | වත්තේගම සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉඩම් කොටසක් ලබා ගැනීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 17 | කුණ්ඩසාල - හාරගම ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීමේ කෙටි කාලීන විසඳුම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලැස්වීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 18 | රාජ්‍ය නිලධාරීන් උදෙසා අතිරේක සුදුසුකමක් ලෙස සංඥා භාෂාව හා බ්‍රේල් මාධ්‍ය සඳහා අතිරේක විෂයක් ස්ථාපනය කිරීම. | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 19 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස අදාළ තනතුරුවල සේවා ව්‍යවස්ථාවන්වල හා බඳවා ගැනීමේ පරිපාටිවල ඇතුලත් කිරීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 20 | අවුරුදු 100 ට වැඩි වැඩිහිටි පුරවැසියන් වෙත මසකට රු.5000/- දීමනාව ලබා ගැනීම. | නැවත සංදේශයක් නිමකර ඇත. |
| 21 | අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන් සඳහා මාසික රු.3000/- ක දීමනාවක් ලබා ගැනීම. | ක්‍රියාත්මක වෙමින් පවතී. |

| | | |
|---|---|---|
| 22 | 2017 අංක 02 දිවිනැගුම (සංශෝධිත) පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනත අනුව ස්ථාපිත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම. | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 23 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුදල් උපදේශන ආයතනයක සේවාව යටතේ ආයෝජනය කිරීම. | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 24 | දුගීබව අවම කිරීම සහ තිරසාර සංවර්ධන සඳහා සමාජ වැඩ පිළිබඳ ජාතික සමුළුව | ක්‍රියාත්මක කර ඇත. |
| 25 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා පත් කිරීම ඩබ්.කේ. තිලකරත්න මහතා ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය) | ක්‍රියාත්මක කර ඇත. |
| 26 | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ශක්තිමත් කිරීම. | ක්‍රියාත්මක කර ඇත. |
| 27 | සූර්ය බල සංග්‍රාමය යටතේ සමෘද්ධිලාභී පවුල් 20,000 කට අතිරේක ආදායම් මාර්ගයක් ලබාදීම සඳහා වහලෙහි සූර්ය බල කට්ටල සවිකිරීම. | ක්‍රියාත්මක වෙමින් පවතී. |

.

## 2. නව බඳවා ගැනීම්

| අනු අංකය | බඳවාගත් තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රියදුරු | 04 |
| 02 | සංවර්ධන නිලධාරී | 02 |
| 03 | සංවර්ධන නිලධාරී (උපදේශන) | 03 |

## 3. විශ්‍රාම ගැනීම්

| අනු අංකය | විශ්‍රාමගත් නිලධාරියාගේ නම හා තනතුර | විශ්‍රාම ගත් දිනය |
|---|---|---|
| 01 | මහින්ද සෙනෙවිරත්න මහතා - ලේකම් | 2017.08.02 |
| 02 | එන්. ඉලංගා මහතා - රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.01.31 |
| 03 | ආර්. පී. වික්‍රමපාල මිය - රාජ්‍ය කළමනාකරණ සහකාර (I) | 2017.03.31 |
| 04 | කේ. අයි. මල්කාන්ති වීරසේකර මිය - රාජ්‍ය කළමනාකරණ සහකාර (I) | 2017.06.20 |

## 4. ස්ථාන මාරුවීම්

| ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ තනතුර | තනතුරු සංඛ්‍යාව | ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| අතිරේක ලේකම් - ශ්‍රී.ලං.ප.සේ විශේෂ | 01 | ලේකම් | 01 |
| ගණකාධිකාරි | 01 | අතිරේක ලේකම් - ශ්‍රී.ලං.ප.සේ විශේෂ | 03 |
| අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ)- විශේෂ | 01 | අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ප.සේ | 01 |
| සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ක්‍ර.සේ | 02 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 | කාර්යාල කාර්ය සහායක | 04 |
| කළමනාකරණ සහකාර (තා/නො) | 01 | සංවර්ධන නිලධාරී (උපදේශන) | 04 |
| කාර්යාල කාර්ය සහයක | 04 | | |
| සංවර්ධන නිලධාරි | 01 | | |
| සංවර්ධන නිලධාරි(උපදේශන) | 02 | | |

## 5. විදේශීය පුහුණු වැඩසටහන්

විදේශීය පුහුණු වැඩසටහන් 49 ක් සඳහා නිලධාරීන් 73 දෙනෙකු සහභාගී වී ඇත.

## 6. අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය

### 6.1 පාලන අංශය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 4 |
| තෘතීය මට්ටම | 4 |
| ද්වීතීය මට්ටම | 22 |
| ප්‍රාථමික මට්ටම | 33 |
| **එකතුව** | 63 |

## 6.2 සමාජ සංවර්ධන අංශය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 4 |
| තෘතීය මට්ටම | - |
| ද්විතීය මට්ටම | 6 |
| ප්‍රාථමික මට්ටම | 5 |
| **එකතුව** | 15 |

## 6.3 මානව සම්පත් සංවර්ධන, කන්ද උඩරට උරුමය හා විශේෂ ව්‍යාපෘති අංශය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | **9** |
| තෘතීය මට්ටම | **-** |
| ද්විතීය මට්ටම | **6** |
| ප්‍රාථමික මට්ටම | **2** |
| **එකතුව** | **17** |

## 6.4 පර්යේෂණ, සංඛ්‍යාලේඛන හා සැලසුම් අංශය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 6 |
| තෘතීය මට්ටම | - |
| ද්විතීය මට්ටම | 5 |
| ප්‍රාථමික මට්ටම | 1 |
| **එකතුව** | 12 |

## 6.5 ගිණුම් අංශය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 |
| තෘතීය මට්ටම | - |
| ද්විතීය මට්ටම | 17 |
| ප්‍රාථමික මට්ටම | 3 |
| **එකතුව** | 21 |

## 6.6 අභ්‍යන්තර විගණන අංශය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 |
| තෘතීය මට්ටම | - |
| ද්විතීය මට්ටම | 4 |
| ප්‍රාථමික මට්ටම | 1 |
| **එකතුව** | **6** |

## 6.7 උපදේශන අංශය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 |
| තෘතීය මට්ටම | - |
| ද්විතීය මට්ටම | 12 |
| ප්‍රාථමික මට්ටම | 1 |
| **එකතුව** | **14** |

## 6.9 ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

| තනතුරු/ සේවා මට්ටම | 2017.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 3 |
| තෘතීය මට්ටම | 2 |
| ද්විතීය මට්ටම | 20 |
| ප්‍රාථමික මට්ටම | 2 |
| **එකතුව** | **27** |

# 7. මූල්‍ය කළමනාකරණය - 2017.01.01 සිට 2017.12.31 දක්වා

## 7.1 ශීර්ෂ අංක 124 යටතේ 2017 වර්ෂයේ දරා ඇති වියදම් පිළිබඳ සාරාංශය

| වියදම් වර්ගය | ඇස්තමේන්තු ප්‍රතිපාදන රු. | අතිරේක ප්‍රතිපාදන රු. | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. | 2017 වර්ෂයේ මුළු වියදම. රු. |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 836,053,000/- | 11,314,112,000/- | 12,150,165,000/- | **11,787,142,825/-** |
| මූලධන | 684,830,000 /- | 69,312,000/- | 754,142,000/- | **342,887,701/-** |
| **එකතුව** | **1,520,883,000/-** | **11,383,424,000/-** | **12,904,307,000/-** | **12,130,030,526/-** |

### 7.2 ශීර්ෂ අංක 216 යටතේ 2017 වර්ෂයේ දරා ඇති වියදම් පිළිබඳ සාරාංශය

| වියදම් වර්ගය | මුළු ප්‍රතිපාදන (රු. මි) | 2017 වර්ෂයේ මුළු වියදම (රු.මි) |
|---|---|---|
| පුනරාවර්තන | 56,777.054 | 52,685.871 |
| ප්‍රාග්ධන | 1,236.700 | 1,179.344 |
| එකතුව | **58,013.754** | **53,865.216** |

### 7.3 ශීර්ෂ අංක 331 යටතේ 2017 වර්ෂයේ දරා ඇති වියදම් පිළිබඳ සාරාංශය

| වියදම් වර්ගය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන (රු.) | අතිරේක ප්‍රතිපාදන (රු.) | මුළු ප්‍රතිපාදන (රු.) | 2017 වර්ෂයේ මුළු වියදම (රු.) |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 495,898,670.00 | 25,000,000.00 | 520,898,670.00 | 483,910,680.00 |
| ප්‍රාග්ධන | 180,305,000.00 | - | 180,305,000.00 | 101,866,928.00 |
| එකතුව | **676,203,670.00** | **25,000,000.00** | **701,203,670.00** | **585,777,608.00** |

## 8. විගණන විමසුම් පිළිබඳ තොරතුරු

### 8.1 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන/අංශ වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් පිළිබඳ තොරතුරු

<table>
<tr><th>විගණන විමසුම් යොමු කරන ලද ආයතනය/අංශය</th><th>යොමු කරන ලද විගණන විමසුම් හා වාර්තා සංඛ්‍යාව</th><th>යොමු කරන ලද විගණන විමසුම් සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග</th></tr>
<tr><td>පාලන, මුදල් , සැලසුම්, සංවර්ධන, උපදේශන අංශ හා ග්‍රාමීය සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය</td><td>21</td><td rowspan="3">i. හඳුනාගත් නිරීක්ෂිත කරුණු තුළින් උපදෙස් මාලා නිකුත් කිරීම.<br>ii. පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම.<br>iii. අංශ වලට අදාල අතිරේක ලේකම් වරුන් සමඟ නිරීක්ෂිත කරුණු සම්බන්ධව රැස්වීම් පවත්වා පසුවිපරම් කිරීම.<br>iv. විගණන නිරීක්ෂණ තුළින් යෝජිත කරුණු පිළිබඳව ප්‍රගතිය පසු විපරම් කිරීම.<br>v. කාර්තු වශයෙන් පවත්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර නැවත පසුවිපරම් කිරීම.</td></tr>
<tr><td>ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව</td><td>13</td></tr>
<tr><td></td><td>කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක DMA/2009 (1) යටතේ සකස් කල යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම.<br><br>මූලික වාර්තා 01<br>සාරාංශ වාර්තා 01<br>කාර්තු වාර්තා 04</td></tr>
</table>

## 8.2 රජයේ විගණන අංශය විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් පිළිබඳ තොරතුරු

| විගණන විමසුම් ඉදිරිපත් කරන ලද ආයතනය/අංශය | ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සංඛ්‍යාව | ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග |
|---|---|---|
| සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | 15 | සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත.<br>විගණන නිරීක්ෂිත තුළින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව ප්‍රගතිය පසු විපරම් කිරීම.<br>කාර්තු වශයෙන් පවත්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර නැවත පසුවිපරම් කිරීම.<br>කළමනාකරණ විගණන වාර්තාවේ නිර්දේශ පදනම් කරගෙන උපදෙස් මාලා නිකුත් කර ඇත.<br>අංශ වලට අදාල අතිරේක ලේකම්වරුන් සමග ඉදිරිපත් කර ඇති නිරීක්ෂිත කරුණු සම්බන්ධව රැස්වීම් පවත්වා පසුවිපරම් කිරීම. |

## 9. සැලසුම් හා මෙහෙයුම් කටයුතු - 2017.01.01 සිට 2017.12.31

1. අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සහ දෙපාර්තමේන්තු වැය ශීර්ෂයන් සඳහා 2017 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
2. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ක්‍රියාකාරකම්වල 2017 අගෝස්තු මස දක්වා ප්‍රගති වාර්තා 12 ක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
3. මාසික ප්‍රගති වාර්තා 12 ක් සකස් කිරීම සහ අයවැය දෙපාර්තමේන්තුවේ ආකෘති පත්‍ර අනුව සකස් කළ කාර්තුමය ප්‍රගති වාර්තා 4ක් මුදල් අමාත්‍යාංශය සහ ව්‍යාපෘති කළමණාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
4. ජනාධිපති ලේකම් කාර්යාලය වෙත කාර්තුමය ප්‍රගති වාර්තා 4 ක් ඉදිරිපත් කිරීම.
5. ආර්ථික කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආදාල කාර්තුමය වාර්තා 02 ක් ව්‍යාපෘති කළමණාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
6. 2016 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර 2017 මැයි 24 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
7. විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත විවිධ වර්ගයේ වාර්තා 40 ක් සකස් කොට යැවීම.
8. BIMSTEC 2017 සමුළුව දෙසැම්බර් 19 සහ 20 දිනයන්හිදී බණ්ඩාරණායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීම.
9. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියළුම ආයතනවල සංවර්ධන නිලධාරීන් සඳහා ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ තෙදින වැඩමුළු 2 ක් පැවැත්වීම

## 10. නව්‍යකරණ වැඩසටහන් - 2017.01.01 සිට 2017.12.31 දක්වා

අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් ආයතනවල ඉලක්කගත කාර්ය සාධනයක් ඇති කිරීමේ අරමුණින් හා තුන් අවුරුදු කාර්ය සාධන සහ උපායමාර්ගික වැඩිදියුණු කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා කාර්යසාධන වැඩිදියුණු කිරීමේ වැඩමුළුවක් 2017 නොවැම්බර් 2,3,4 දිනයන්හි දී ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනයේ දී පවත්වන ලදී. මේ සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අංශ හා දෙපාර්තමේන්තු නියෝජනය කරමින් නිලධාරීන්, ගරු අමාත්‍යතුමා සහ ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය සමඟ 125 දෙනෙකු සහභාගී විය. ඒ අනුව 2018 – 2020 සඳහා සකස්කරනු ලබන මෙම කාර්ය සාධන සහ උපායමාර්ගික සැලැස්ම 2018 වර්ෂයේ අප්‍රේල් මස වන විට සකස්කර අවසන් කිරීමට නියමිතය.

**අමාත්‍යාංශය සඳහා තුන් අවුරුදු කාර්ය සාධන සහ උපායමාර්ගික වැඩිදියුණු කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළුව - ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනයේ දී පවත්වන ලදී.**





02

# උපදේශන අංශය



# 02. උපදේශන අංශය

## 2.1 හැඳින්වීම

- උපදේශන සේවය අවැසි පුද්ගලයන් හට උපදේශන සේවා ලබා දීම උදෙසා 2005 වර්ෂයේදී මෙම අංශය පිහිටුවා ඇත.

## 2.2 කාර්යයන්

i. උපදේශන සේවාව සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.

ii. උපදේශන සේවා සම්බන්ධයෙන් ප්‍රමිතීන් සකස් කිරීම.

iii. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් උපදේශන නිලධාරීන් අනුයුක්ත කර උපදේශන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම.

iv. උපදේශන සේවා අවශ්‍යතා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට උපදේශන නිලධාරීන්ගේ සේවය ලබාදීම (රෝහල් - මානසික රෝග සායනය/ ආඝාත රෝග සායනය/ පිළිකා රෝග සායනය/ වකුගඩු රෝග සායනය, බන්ධනාගාර, ළමා හා වැඩිහිටි නිවාස, ගුවන්සේවා සමාගම).

v. උපදේශන සේවයේ සහාය ලබාගැනීමට අත්‍යාවශ්‍ය නමුත් කාර්යාල ගත නිලධාරියකු හමුවීමට නොහැකි තත්වයක දී හෝ අවස්ථාවක දී සේවය ලබා ගැනීමට පහසුකම් සැලසීම වෙනුවෙන් 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාවක් ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසනයන්ට ගොදුරු වූ ප්‍රජාව සඳහා ව්‍යසන උපදේශන සායන පැවැත්වීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vii. සංවර්ධනාත්මක හා නිවාරණාත්මක උපදේශන වැඩසටහන් පැවැත්වීම තුළින් උපදේශන සේවාව ප්‍රචලිත කිරීම.

viii. උපදේශන සේවාව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් කුසලතා සංවර්ධනය කිරීම.

ix. උපදේශන සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කිරීම.

x. උපදේශන විෂය ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක හා දැනුම ප්‍රවර්ධනය සඳහා මුද්‍රිත ප්‍රකාශන නිකුත් කිරීම (සිංහල හා දෙමළ මාධ්‍ය).

## 2.3 කාර්ය සාධනය - 2017.01.01 සිට 2017.12.31 දක්වා

### 2.3.1 මානව සම්පත් කළමණාකරණය

#### 2.3.1.1 දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය |
|---|---|---|---|
| නවක සංවර්ධන නිලධාරීන් (උපදේශන) සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන (විගණනය/මුදල් රෙගුලාසි/ආයතන සංග්‍රහය/උපදේශන නිලධාරීයකුගේ භූමිකාව යන විෂයයන් පිළිබඳව) | 19 | 2017.03.06/07/08 | ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානය, තලාහේන |
| සංවර්ධන නිලධාරී (උපදේශන) සඳහා වූ කුසලතා සංවර්ධන නේවාසික පුහුණු වැඩමුළුව (නාට්‍ය ප්‍රතිකාර, චිත්‍ර ප්‍රතිකාර, සංගීත ප්‍රතිකාර හා නව සමාජ ප්‍රවණතා හේතුවෙන් ඇතිවන මානසික ව්‍යාධින් යන ක්ෂේත්‍ර පිළිබඳව) | 75 | 2017.08.21/22/23 | පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනය |
| දමිළ මාධ්‍ය උපදේශන නිලධාරීන් සඳහා කුසලතා සංවර්ධන නේවාසික පුහුණු වැඩමුළුව (මානසික සෞඛ්‍ය ප්‍රථමාධාර, අපදා කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ) | 42 | 2017.10.23/24/25 | යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයට අනුබද්ධ පුහුණු ආයතනය, පරසන්කුලම්, පුලියන්කුලම |

### 2.3.2 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

#### 2.3.2.1 වියදම් සාරාංශය

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 15.00 | 14.985 |

### 2.3.2.2 ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| ජාතික උපදේශන දිනය සැමරීම | 15 | 2.527 | සහභාගිකයන් |
| 24 පැය ජංගම දුරකථන උපදේශන සේවාව විධිමත් ක්‍රමවේදයක් සහිතව ප්‍රතිනිර්මාණය කිරීම. | | 0.24 | සේවාලාභීන් 5491 |
| උපදේශන නිලධාරීන්ගේ නිපුණතාවන් සංවර්ධනය කිරීම | | 1.42 | නිලධාරීන් 192 |
| උපදේශන සේවාව ප්‍රවර්ධනය සඳහා වන ප්‍රචාරණය | | 1.78 | සඟරා 2000<br>අත්පත්‍රිකා 190,000<br>බැනර් 212 |
| ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් උපදේශන ක්‍රියාකාරම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය | | 0.37 | රැස්වීම් 224 |
| ප්‍රජාව මානසික ව්‍යාකුලතාවන්ට ගොදුරු වීම වැළැක්වීම සඳහා කණ්ඩායම් උපදේශන වැඩසටහන් පැවැත්වීම | | 8.161 | වැඩසටහන් 363<br>ප්‍රතිලාභීන් 19712 |
| වෙනත් | | 0.502 | අතිරේක ඉන්ධන/ ලිපි ද්‍රව්‍ය/ සිත්සරණ උපදේශන මධ්‍යස්ථානවල විදුලි බිල්පත් හා පිරිසිදු කිරීම් ගාස්තු |

## 2.3.3 අත්කරගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

ජාත්‍යන්තර මානසික සෞඛ්‍ය සතියට සමාගාමීව උපදේශන ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන් අතර උපදේශන සේවාව නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා මූලිකත්වය ගැනීම හා නව ප්‍රවණතා පිළිබඳ කතිකාවතක් ඇති කිරීමට හැකි වීම.

i. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් තනි පුද්ගල උපදේශන සේවා සැපයීම තුළින් සේවාලාභීන් මානසිකව සවිබල ගැන්වීමට හැකි වීම.

ii. මානසික රෝග අවම කිරීමට හා මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් 6,547 ක් මඟින් ප්‍රතිලාභීන් 318,768 ක් දැනුවත් කිරීමට හැකි වීම.

iii. උපදේශන ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා පිළිබඳ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කර සේවාලාභීන් සඳහා ගුණාත්මක උපදේශන සේවා සැපයීම සඳහා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය කිරීමට හැකි වීම.

iv. උපදේශන විෂය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ප්‍රවර්ධනය කිරීමට හැකි වීම.

## 2.3.4 ජයග්‍රහණ

i. බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උපදේශන නිලධාරී වෙත යොමු වූ සිඟමන් යදින පවුලක් (මව, පියා හා දරුවන් තිදෙනාගෙන් යුත් පවුලක්) සඳහා සමෘද්ධි සංවර්ධන ඒකකයේ මැදිහත්වීමෙන් නිවසක් ඉදිකර දීම.

ii. දීප ව්‍යාප්තව සේවයේ නියුතු උපදේශන නිලධාරින්ගේ මැදිහත්වීමෙන් සියදිවි නසා ගැනීමට තැත් කළ පුද්ගලයන් 11 දෙනෙකු ඉන් මුදවා ගැනීම.

iii. හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සම්බන්ධීකාරක (උපදේශන) ඩබ්ලිව්.කේ.කේ. කෝකිලා මහත්මියගේ පූර්ණ සම්බන්ධීකරණයෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සිරිබෝපුර ග්‍රාම නිලධාරී වසමේ දිළිඳු පවුලක් සඳහා අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ මැදිහත්වීමෙන් යුධ හමුදා මුලස්ථාන අනුමැතියෙන් හම්බන්තොට කටුවැව 12 වැනි සේනාංකයේ ඉංජිනේරු සහාය සහිතව නිවසක් ඉදිකිරීම.

iv. අවිස්සාවේල්ල සාලාව ප්‍රදේශය/ කෑගල්ල අරණායක, බුලත්කොහුපිටිය ප්‍රදේශ/ කොලොන්නාව මීතොටමුල්ල ප්‍රදේශය/ රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුර ආපදා අවස්ථාවේ දී ජාතික මට්ටමින් අනෙකුත් අමාත්‍යාංශ හා සේවා සම්බන්ධීකරණය කරමින් ඒකාබද්ධ ප්‍රවේශයකින් උපදේශන මැදිහත්කරණ වැඩසටහන් සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

v. කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඔළු කරඹ ප්‍රදේශයේ සැරිසැරූ යාචක පුද්ගලයකු, සමාජ සේවා නිලධාරී/ පළාත් සමාජ සේවා නිලධාරී හා මනෝවෛද්‍ය නිලධාරී අසිත කෝසල මහතාගේ දායකත්වයෙන් වැඩිහිටි නිවාසයකට යොමු කර කායික, මානසික හා සමාජීය නිරෝගීභාවය තහවුරු කිරීම.

vi. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කන්දකාඩු හා සේනපුර පිහිටි මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපන කඳවුරේ පුනරුත්ථාපනලාභීන් සඳහා උපදේශන සේවාව ලබා දීමටත් කාර්ය මණ්ඩලය සඳහා උපදේශන පුහුණු ලබා ගැනීමටත් උපදේශන නිලධාරීන්ගේ සේවය දීර්ඝකාලීනව අත්‍යවශ්‍ය බව දන්වා තිබීම.

vii. දරුවකුට රැකවරණය, සංවර්ධනය මෙන්ම අනාගත සුබසාධනය සඳහා අත්‍යවශ්‍ය බැවින් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සම්බන්ධීකාරක (උපදේශන) ඩබ්ලිව්.කේ.කේ. කෝකිලා මහත්මිය වෙත යොමු වූ දෙමාපියන් අහිමි වූ ආච්චි සමඟ ජීවත් වන දරුවකු සඳහා සිංහ සමාජ සහයෝගයෙන් විදේශීය කැපකරු මාපිය යුවලක් සොයා දීම සිදු කර ඇත.

viii. හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සම්බන්ධීකාරක (උපදේශන) ඩබ්ලිව්.කේ.කේ. කෝකිලා මහත්මියගේ පූර්ණ සම්බන්ධීකරණයෙන් ගල්කිස්ස සිංහ සමාජය දායක කර ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ දුෂ්කර පාසලක් වන බූන්දල කණිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවන් සඳහා අවශ්‍ය වන පොත්පත් හා භෞතික උපකරණ ලබා ගැනීම.

ix. ළමා සංවර්ධනයේ දී හසුරු කුසලතා ක්‍රියාකාරකම් ඉතා වැදගත් වන අතර එම ක්‍රියාකාරකම් වැඩි දියුණු කර දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය පිළිබඳ පෙර පාසල් ගුරුවරුන් හා දෙමාපියන් සඳහා නව උපකරණ භාවිතා කර කටයුතු කිරීමේ හැකියාව සංවර්ධනය කරනු ලබන වැඩසටහන් පැවැත්වීම.





2017 ඔක්තෝබර් 16 දින වස්කඩුව සිට්‍රස් හෝටල් පරිශ්‍රයේ දී පැවැත් වූ ජාතික උපදේශන දින සැමරුම් උත්සවයේ විශේෂ අවස්ථා කිහිපයක්




කොලොන්නාව මීතොටමුල්ල කුණු කන්ද නාය යෑම අවස්ථාවේ දී උපදේශන මැදිහත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම





## පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ දී පැවැත්වූ වැඩසටහනේ අවස්ථා කිහිපයක්





## “පිබිදෙමු පොළොන්නරුව“ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනේ අවස්ථා කිහිපයක්





## ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවාලාභී ඇගයීමේ ආකෘති පත්‍ර පිළිබඳ පසු විපරම් වැඩසටහන





**නව්‍යකරණ වැඩසටහන් යටතේ බෙන්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී (උපදේශන) වෙනුර සනත් කුමාර මහතා විසින් ක්‍රියාත්මක කළ වැඩසටහනේ විශේෂ අවස්ථා හා එම වැඩසටහන පිළිබඳ මාධ්‍ය වාර්තා කර තිබූ ආකාරය**







03

# ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය



# 03. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## 3.1 හැඳින්වීම

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 1974 වර්ෂයෙහි ස්ථාපිත වන්නේ මෙරට සහභාගීත්ව සංවර්ධන, සංවර්ධන ක්ෂෙත්‍රයට ගලපා ලූ මූලික සහ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වශයෙනි. 1978 වර්ෂයෙහි ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් විපර්යකාරක ක්‍රමවේදය සංවර්ධන විෂය ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී. ප්‍රථමවරට ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්ෂේත්‍රයට කාර්යබද්ධ පර්යේෂණ ක්‍රමවේදය ගලපාලනු ලැබුවේ ද ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසිනි. මෙරට ක්‍රියාත්මක වූ ජනසවිය, සමෘද්ධි සහ ගමනැගුම වැනි ප්‍රමුඛතම රාජ්‍ය වැඩසටහන් සඳහා ප්‍රජා සහභාගීත්වය යොදා ගැනීම උදෙසා මෙම ආයතනයේ සමාජ සජීවීකරණ ක්‍රමවේදය භාවිතා කරන ලදී. මේ වනවිට ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය පුහුණු පර්යේෂණ, ප්‍රකාශන හා සැලසුම් යන ප්‍රධාන අංශ 04 ක් යටතේ ක්‍රියාත්මක වේ.

## 3.2 කාර්යයන්

- සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ පුහුණු,පර්යේෂණ හා ප්‍රකාශන කටයුතු සිදු කිරීම.
- ග්‍රාමීය සංවර්ධනය උදෙසා තුඩුදෙන විපර්යකාරක සිද්ධාන්තය පාදක කරගත් ප්‍රජා මූලික සංවිධාන පිහිටුවීම හා ඒවා ශක්තිමත් කිරීම.
- ප්‍රජා මූලික සංවිධානයන්ට හා ග්‍රාමීය ප්‍රජාව වෙත සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ තොරතුරු, අත්දැකීම් හා පුහුණු අවස්ථා ලබාදීම.
- දිළිඳුකම පිටුදැකීම, දිළිදුකම හා සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම හා ඒ තුලින් ප්‍රජාව සවිබල ගැන්වීම.
- සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය සංවර්ධනය හා යාවත්කාලීන කිරීමට අදාළ කාර්යබද්ධ පර්යේෂණ පැවැත්වීම.
- පර්යේෂණ තොරතුරු සන්නිවේදනය සඳහා සඟරා, පුවත්පත් හා ග්‍රන්ථ ප්‍රකාශනය.
- ග්‍රාමීය සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ප්‍රචලිත කිරීම හා දැනුවත් කිරීමට අදාළ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සංවර්ධන අත්දැකීම් හුවමාරුව සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුහුණු පර්යේෂණ හා ප්‍රකාශන කටයුතුවල නිරත නිලධාරීන්ගේ හැකියා වර්ධනයට කටයුතු කිරීම.
- ආයතනයේ අභිවෘද්ධිය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කිරීමේ වැඩසටහන් සංවිධානය.

## 3.3 කාර්ය සාධනය - 2017.01.01 සිට 2017.12.31 දක්වා

### 3.3.1 භෞතික සම්පත් සංවර්ධනය

| කාර්යය | ප්‍රගතිය | ආයෝජනය (රු.මි) |
|---|---|---|
| පිළිමතලාව මධ්‍යස්ථානයේ භූමිය සංවර්ධනය කිරීම | සියලු වැඩ නිමකර ඇත. | 0.44 |
| පිළිමතලාව මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | සියලු වැඩ නිමකර ඇත. | 0.53 |
| පිළිමතලාව මධ්‍යස්ථානයේ භූමිය වටා ආරක්ෂක වැට ඉදි කිරීම | සියලු වැඩ නිමකර ඇත. | 0.55 |
| ආයතනයේ ප්‍රධාන නාම පුවරුව සකස් කිරීම | සියලු වැඩ නිමකර ඇත. | 0.03 |
| එකතුව | | **1.55** |

### 3.3.2 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

#### 3.3.2.1 වියදම් සාරාංශය

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 6.55 | 4.12 |

#### 3.3.2.2 ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | භෞතික |
| වාර්ෂික පුහුණු කැලැන්ඩරය ක්‍රියාත්මක කිරීම | 1.0 | 1.18 | පුහුණුලාභීන් 493 කගේ සහභාගිත්වයෙන් වැඩසටහන් 21 සාර්ථකව නිම කරන ලදී. |
| ගෘහ කළමනාකරණ පුහුණු මැදිහත්වීම | 1.3 | 0.85 | පුහුණුලාභීන් 985 කගේ සහභාගිත්වයෙන් වැඩසටහන් 28 සාර්ථකව නිම කරන ලදී. |
| ව්‍යවසායකත්ව පුහුණු මැදිහත්වීම | 0.7 | 0.63 | පුහුණුලාභීන් 613 කගේ සහභාගිත්වයෙන් වැඩසටහන් 20 සාර්ථකව නිම කරන ලදී. |
| පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන | 0.2 | 0.08 | තෝරාගත් ගම්මාන 03ක ගැටළු හඳුනා ගනිමින් ඒවාට විසඳුම් සෙවීම උදෙසා ගම්වාසීන් සහ නිලධාරීන් 125 සහභාගිත්වයෙන් වැඩසටහන් 03ක් පවත්වා වැඩ සැළැස්මක් සකස්කර ඇත. |
| දිළිදුකම පිටුදැකීම හා ග්‍රාම සංවර්ධනයට අදාළ විවෘත සංවාද වැඩසටහන | 0.40 | 0.27 | පළමු වැඩසටහන 2017.03.02 දින පැල්ගහතැන්න පුහුණු ආයතනයේ ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වා අවසන් කරන ලදී. |
| ප්‍රජා ශක්ති සංවිධාන ශක්තිමත් කිරීමේ වැඩසටහන | 0.50 | 0.18 | සියලුම සංවිධාන සඳහා සම්බන්ධීකාරකවරුන් පත් කර ඇති අතර පුහුණු හා පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| ආලෝකගම ග්‍රාම නිලධාරී වසම තුළ සිදු කරන කාර්යබද්ධ පර්යේෂණය | 0.30 | 0.06 | මෙම ගම්මානයේ ජීවත්වන පවුල් 198 න් පවුල් 75 ක් දැනට නිරීක්ෂණය කර ඇති අතර ඒ අනුව පවුල් වල මූලික තොරතුරු රැස් කරමින් පවතී. |
| ස්වභාවික ආපදාවන්ට ලක්වූ ප්‍රජාවගේ දුගී බව තුරන් කරලීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් වල සාර්ථකත්වය විමසා බැලීම හා ඒ සඳහා ගත යුතු නව උපාය මාර්ග හඳුනා ගැනීම. | 0.20 | 0.13 | විල්ගමුව, වැලිකන්ද, පදවිය, මට්ටක්කුලිය සහ අරණායක යන ප්‍රදේශ වල සිදු වූ ආපදා තත්වයන් පිළිබඳව සැළකිල්ලට ගෙන සමීක්ෂණය සඳහා එම ප්‍රදේශ තෝරා ගෙන ඇති අතර එම ගම්මාන වල මූලික නිරීක්ෂණ අරඹා ඇත. |
| වස විසෙන් තොර ආහාර පරිභෝජනය තුළින් නිරෝගිමත් ග්‍රාමීය ප්‍රජාවක් බිහි කිරීමේ සමාජ සජීවීකරණ වැඩසටහන | 0.80 | 0.15 | වැඩසටහන් 7ක් සාර්ථකව පවත්වා ඇත. |
| ග්‍රාම සංවර්ධන ක්ෂේත්‍රයට අදාළව තෝරා ගන්නා ලද ප්‍රත්‍යක්ෂ අධ්‍යයන සිදු කිරීම | 0.1 | 0.05 | සිද්ධි අධ්‍යයනයන් දෙකක් සාර්ථකව නිමකර වාර්තාව ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත. |
| ප්‍රජාශක්ති සගරාව ප්‍රකාශයට පත් කිරීම | 0.25 | 0.13 | පිටපත් 1000 මුද්‍රණය කර බෙදාහැර ඇත. |
| තරණය පුවත්පත ප්‍රකාශයට පත්කිරීම | 0.1 | 0.07 | පිටපත් 2000 මුද්‍රණය කර බෙදාහැර ඇත. |
| ග්‍රාමසංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රීය සගරාව ප්‍රකාශයට පත්කිරීම | 0.3 | 0.16 | පිටපත් 500 මුද්‍රණය කර පරිශීලනය සඳහා පරිග්‍රහණ ගතකර ඇත. |
| පුස්තකාල සංවර්ධනය හා පොත් මිලදී ගැනීම | 0.1 | 0.1 | පුස්තකාලය සඳහා පොත් 300 මිලදී ගෙන පරිශීලනය සඳහා පරිග්‍රහන ගත කර ඇත |
| වෙබ් අඩවිය නිර්මාණය කිරීම | 0.1 | - | |
| මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 0.10 | 0.05 | ප්‍රගති සමාලෝචන රැස්වීම් 6 ක් පවත්වා ඇත. |
| 2018වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සැකසීම | 0.10 | 0.03 | 2018 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා වැඩමුළු 2 ක් පවත්වා ඇත. |
| **එකතුව** | **6.5** | **4.12** | |

## 3.3.3 අත්කරගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

i. ආයතනයේ ක්‍රියාත්මක කල විවිධ පුහුණු වැඩසටහන් තුළින් අඩු ආදායම්ලාභී පවුල් 1800 ක් සවිබල ගැන්වීම සඳහා උර දීම.

ii. කුඩා පරිමාණ ව්‍යවසායකයන් 613 ක් ගොඩනැංවීම.

iii. ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ පවුල් 200 ක් සවිබල ගැන්වීම සඳහා උර දීම

iv. දිළිදුකම පිටුදැකීම හා ග්‍රාම සංවර්ධනයට අදාළ විවෘත සංවාද වැඩසටහන් දෙකක් පවත්වා අවසන් කිරීම

## 3.3.4 ජයග්‍රහණ

i. දිළිඳුකම අවම කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන්වල දායකත්වය යන මාතෘකාවට අදාලව විවෘත සංවාදයක් පැවැත්වීම.

ii. පුබුදමු පොළොන්නරුව වැඩසටහන යටතේ ගම්මාන තුනක ගැටලු හඳුනා ගනිමින් ඒවාට විසඳුම් සෙවීම සඳහා සැළැස්මක් සකස් කිරීම.

iii. ප්‍රජාව සවිබල ගැන්වීම උදෙසා තෝරාගත් ගම්මාන තුළ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

**සහභාගීත්ව නායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව**



**ගෘහ කළමනාකරණය වැඩසටහන - ගලිගමුව ප්‍රා.ලේ.**



**ව්‍යවසායකත්ව පුහුණු මැදිහත්වීම**



**පිබිදෙමු පොළොන්නරුව ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය.**



**ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ කාර්ය බද්ධ පර්යේෂණ වැඩසටහන.**



**ස්වභාවික ආපදාවන්ට ලක්වූ ප්‍රජාවගේ දුගී බව තුරන් කරලීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් වල සාර්ථකත්වය විමසා බැලීම.**



04

# සමාජ සේවා දෙපාර්තමේන්තුව



# 04. සමාජ සේවා දෙපාර්තමේන්තුව

## 4.1 හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංන්ස් මහතාගේ සභාපතිත්වයෙන් 1944 වර්ෂයේ දී පත් කරන ලද සමාජ සේවා කොමිෂන් සභාවේ නිර්දේශයක් මත 1948 පෙබරවාරි මස 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. ආරම්භයේ දී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වූයේ අප රට තුළ ජීවත්වන වතු කම්කරුවන්, දිළිඳු පවුල් හා එම පවුල්වල සාමාජිකයින් විවිධ රෝගාබාධයන්ට ගොදුරු වන හා ආපදාවන්ට ලක්වන අවස්ථාවල දී මුල්‍යමය ආධාර සැපයීමයි. ප්‍රාථමික අවස්ථාවේ පැවැති මෙම වැඩසටහන්, කාලීන අවශ්‍යතා මත යාවත්කාලීන කරමින් දෙන ලද සහනය යැපුම් මානසිකත්වයට සීමා නොකොට පුද්ගලයාගේ හෝ පවුලේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය ඇති කිරීම සඳහා පරිවර්තනය කොට ඇත.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ අප මේ පසු කරන වත්මන් අවධිය තුළ අප රට තුළ දැන නොදැන කරන ලද මිනිස් ක්‍රියාකාරකම් හෝ පාරිසරික ගැටළු හේතු කොට ගෙන පුද්ගලයන් විවිධ ආබාධිත තත්ත්වයට පත්වීම, සාඵල්‍යතාවය අඩුවීම, බෝනොවන රෝග වර්ධනය වීම, මනෝ වික්ෂිප්තභාවයට පත්වීම, සියදිවි නසාගැනීම, දිළිඳුකම හා මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම යන කාලීන සමාජ ගැටළු රාශියකට රජයට මුහුණ දීමට සිදුවී ඇත. මෙම තත්ත්වය පුද්ගලයාගේ මෙන්ම සමස්ථ සමාජයේම ප්‍රගමනයට සෘජු හෝ වක්‍රව දැඩි අහිතකර බලපෑම් සිදු කරයි.

මෙවැනි ආන්තීකරණයට හා අවාසිසහගත තත්ත්වයන්ට පත් ජන කොටස් ඉලක්ක කරගනිමින් ඔවුන් ස්වෝත්සාහයෙන් නගාසිටුවමින්, ජාතික සංවර්ධනයේ සක්‍රීය කොටස්කරුවන් කිරීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අරමුණ වී ඇත. ඒ සඳහා විවිධ පර්යේෂණ ,ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා සංවර්ධන වැඩසටහන් ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයන් හරහා ක්‍රියාවට නැංවීම සිදුකොට ඇත. විශේෂයෙන් දෙපාර්තමේන්තුව, ආබාධිත ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද සුබසාධන වැඩසටහන්, මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබා දීම, සමාජගත කිරීම හා කාලීන සමාජ ගැටළු අවම කිරීම ඒ අතර ප්‍රධාන වැඩසටහන් කිහිපයකි.

ආබාධ සහිත ප්‍රජාව සඳහා ජාතික මට්ටමේ වැඩසටහන් හතරක් 2017 වර්ෂයේ පැවැත්වීමට හැකි විය. ආබාධ සහිත තැනැත්තන්ගේ " 2017 ජාතික මලල ක්‍රීඩා උළෙල", "2017 ස්වශක්ති අභිමානී සම්මාන ප්‍රදානය", "2017 සිත් රූ සංස්කෘතික උළෙල" හා 2017 ජාත්‍යන්තර සුදුසැරයටි දිනයට සමගාමීව " ජාතික සුදු සැරයටි සුරක්ෂා දින උළෙල - 2017" ඉතා සාර්ථකව පැවැත්වීමට හැකිවිය. මෙම වැඩසටහන් තුළින් අභ්‍යාසලාභීන් හා ඔවුන්ගේ දෙමාපියන්, කාර්ය මණ්ඩලය හා සෙසු සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සුහදතාව, අවබෝධය හා විශ්වසනීයත්වය ඇති කිරීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන් උතුරු නැගෙනහිර ආබාධිත තරුණ තරුණියන්ගේ සුබසාධනය සඳහා කිලිනොච්චියේ සහ මඩකලපුවේ නව ඉදිකිරීම් දෙකක් සඳහා මුල්ගල් තැබීමත්, ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයක් පිහිටු වීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ටාව නගරයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමත් මෙම වර්ෂයේ සිදුකිරීමට හැකිවිය. සේවා සපයන

නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා දේශීය විදේශීය වැඩමුළු ,සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සිදුකොට ඇත

සමස්තයක් වශයෙන් ගත් කල අවාසි සහගත හා පීඩාවන්ට පත් ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළ ඉතා සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වූ බව 2017 වර්ෂයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තුළින් මනාව පැහැදිලි වේ. 2017 වර්ෂය සඳහා ඉදිරිපත් කළ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. 520,898,670.00 ක් ලැබුණු අතර, සේවා අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා රු. 483,910,680.00 ක් වියදම් කොට ඇත. මූලධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. 180,305,000.00 ක් වෙන් වූ අතර මෙම වර්ෂය තුළදී අදාළ කාර්යයන් සඳහා රු. 101,866,928.00 ක් වැය විය. එය 2017 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කවලින් 83.54%ක ප්‍රගතියකි.

2017 වර්ෂය විශේෂයෙන් කැපී පෙනෙන වර්ෂයක් විය. ඉතා කෙටි කාලයක් තුළ ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් හතරක් පැවැත්වීමටත් නව ඉදිකිරීම් තුනක් සඳහා ආරම්භයක් ලබා දීමටත් හැකිවිය. මෙම වර්ෂයේ මැදභාගයේ දිවයිනේ පැවැති අයහපත් කාලගුණික තත්ත්වය හේතුකොට ගෙන හදිසි ආපදා තත්ත්වයට පත් ජන කොටස් එම තත්ත්වයෙන් මුදවාගෙන අත්‍යාවශ්‍ය සේවා ඉතා කඩිනමින් ලබා දීම සඳහා සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් මැදිහත්ව කටයුතු කර ඇත.

## 4.2 කාර්යයන්

- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබා දීම හා විවෘත රැකියා සඳහා යොමු කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනාගැනීම හා පුළුල් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනීමට පර්යේෂණ කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා ආධාරක උපකරණ සැපයීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌනතා ඇති පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුබසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.
- වයස අවු. 60 අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට පෙනීම ලබා දීම සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම.
- දෘශ්‍යාබාධිත දරුවන්ට ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික ආධාර ලබා දීම.
- ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා ලබා දීම.
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- ඒකාබද්ධ ප්‍රවේශය හරහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම, මත් නිවාරණ හා පුනරුත්ථාපන වැඩසටහන්,දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික, පවුල් සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම.
- පුණ්‍යායතන ලියාපදිංචි තත්ත්වය ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දීම, ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා සහන ලබාදීමට නිර්දේශ කිරීම.
- සේවා සපයන නිලධාරීන්ගේ දැනුම කුසලතාවය හා ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා යොමු කිරීම.

## 4.3 කාර්ය සාධනය - 201701.01 සිට 2017.12.31 දක්වා

### 4.3.1 භෞතික සම්පත් සංවර්ධනය

| කාර්යය | ආයෝජනය (රු.මි) |
|---|---|
| **ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයේ දොර සවි කිරීම.** | 0.035 |
| **අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය** | |
| • ජනෙල් වල ග්‍රිල් සවි කිරීම<br>• නව ගොඩනැගිල්ලේ ප්‍රවේශ මාර්ගයේ ආරක්ෂිත වැටක් හා ගේට්ටුවක් සවි කිරීම | 0.800 |
| නව ගොඩනැගිල්ලේ ජනෙල්වල ස්ටිකර් ඇලවීම | 0.093 |
| නව ගොඩනැගිල්ලේ සමරුඵලකය සකස් කිරීම | 0.052 |
| **සීදූව වෘත්තීය පුහුණු ආයතනය** | |
| කාර්යාලයේ වැසිකිළි පද්ධතිය අළුත් වැඩියා කිරීම | 0.450 |
| **වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය** | |
| පැනල් බෝර්ඩ් සවිකිරීම | 0.197 |
| උපස්ථායක නිල නිවස සිවිලිම සකස් කිරීම. | 0.241 |
| කාර්යාලය සඳහා ගොඩනැගිල්ල ඉදිකර ගැනීම | 2.000 |
| නිලධාරින්ගේ වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 1.094 |
| දොර ජනෙල් අලුත් වැඩියා කිරීම | 0.885 |
| **තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය** | |
| නව ගොඩනැගිලි සමරුඵලකය සකස් කිරීම | 0.052 |
| **වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය** | 1.200 |
| අධිකාරි නිල නිවස අලුත්වැඩියා කිරීම | |
| **වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය** | |
| **පුවක්පිටිය ජයවීරු සෙවන ආයතනය** | |
| මුළුතැන්ගෙය පුළුල් කිරීම | 2.015 |
| නව ගොඩනැල්ල හා පැරණි ගොඩනැගිල්ල යා කරමින් වැසි ආවරණයක් සකස් කිරීම. | 0.355 |

| | |
|---|---|
| • ශ්‍රවණාගාරය අලුත්වැඩියා කිරීම | * |
| • නිලනිවාසය අලුත් වැඩියා කිරීම | * |
| **කැටවල වෘත්තීය පුහුණු ආයතනය** | |
| • කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 1.825 |
| • නිලධාරීන්ගේ වැසිකිළි පද්ධතිය හා ගබඩාව සකස් කිරීම | 1.220 |
| **සීදුව වෘත්තීය පුහුණු ආයතනය** | |
| • සම් භාණ්ඩ හා පාවහන් අංශය ගොඩනැගිල්ල ඉදිකිරීම් | 3.345 |
| • දිරිය පොල ඉදිකිරීම | 1.900 |
| **මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය** | |
| • වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 0.209 |
| • ජලනල පද්ධතිය සකස් කිරීම | 0.069 |
| • නාන කාමරය සකස් කිරීම | 0.776 |
| • නේවාසිකාගාරයේ ග්‍රිල් වැට ඉදිකිරීම | 0.085 |
| **අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය** | |
| පරණ ගොඩනැගිල්ලේ සිට නව ගොඩනැගිල්ල දක්වා ප්‍රවේශ පහසුකම් සැපයීම | 2.270 |
| **තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය** | |
| මිදුල කොන්ක්‍රීට් ගල් ඇතිරීම | 1.509 |
| **කලවාන වෘත්තීය පුහුණු ආයතනය** | |
| • මුළුතැන්ගෙය ඉදිරි පස කාණු පද්ධතිය සකස් කිරීම | * |
| • පිවිසුම් දොරටුව අසල බැම්ම හා වැට සකස් කිරීම | * |
| **කොට්ටාව - ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය ඉදිකිරීම** | 9.135 |
| **කිළිනොච්චිය - වෘත්තීය පුහුණු ආයතනය ඉදිකිරීම** | 22.125 |
| **මඩකලපුව - වෘත්තීය පුහුණු ආයතනය ඉදිකිරීම** | 24.736 |

## 4.3.2 මානව සම්පත් කළමණාකරණය

### 4.3.2.1 දේශීය පුහුණු වැඩසටහන්

| දේශීය පුහුණු වැඩසටහන | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය |
|---|---|---|---|
| ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | ඩී.ටී.ඩී. එදිරිසිංහ මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක | අවුරුදු 01 (2017) | මිලෝදා - (Academy of Financial Studies ) |

| | | | |
|---|---|---|---|
| බැහැරගත ක්‍රියාකාරකම් සහිත පුහුණු වැඩසටහන - වාර්ෂික ප්‍රගති සමාලෝචන වැඩසටහන. | දෙපාර්තමේන්තු නිලධාරීන් 100 ක් | 2017.12.16 | මහනුවර දිගන "අපේක්ෂා නිවස" |
| උපදේශන ඩිප්ලෝමාව | එන්.ඩී.බී. මනෝරි මිය | පෙබරවාරි | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| සමාජ වැඩ ඩිප්ලෝමාව | ක්ෂේත්‍ර නිලධාරීන් 29ක් | අවුරුදු 02ක් (2017/2018) | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| බැහැරගත පුහුණු වැඩසටහන | ත්‍රිකුණාමලය/ අනුරාධපුර/වව්නියාව/ අම්පාර /මඩකලපුව/ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් 50ක් | මාර්තු | දඹුල්ල - ඉබ්බන්කටුව |
| බැහැරගත පුහුණු වැඩසටහන | ගම්පහ/ හම්බන්තොට/මොණරාගල / කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් 61ක් | මාර්තු | දඹුල්ල/ ඉබන්කටුව |
| ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික පුහුණු වැඩසටහන | රත්නපුර/ කුරුණෑගල /අනුරාධපුර/ පුත්තලම යන දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් 65ක් | අගෝස්තු | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය |
| ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික පුහුණු වැඩසටහන | මාතර/කෑගල්ල /ගාල්ල යන දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් 65ක් | අගෝස්තු | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය |

## 4.3.3 භෞතික හා මූල්‍ය ප්‍රගතිය – 2017

### 1.3.3.4 වියදම් සාරාංශය

| වියදම් වර්ගය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන (රු.) | අතිරේක ප්‍රතිපාදන (රු.) | මුළු ප්‍රතිපාදන (රු.) | 2017 වර්ෂයේ මුළු වියදම (රු.) |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 495,898,670.00 | 25,000,000.00 | 520,898,670.00 | 483,910,680.00 |
| ප්‍රාග්ධන | 180,305,000.00 | - | 180,305,000.00 | 101,866,928.00 |
| **එකතුව** | **676,203,670.00** | **25,000,000.00** | **701,203,670.00** | **585,777,608.00** |

## 4.3. 2.3 ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | භෞතික |
| ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන | | | |
| 2017 වර්ෂයේ දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි ආබාධිත ප්‍රජාව වෙනුවෙන් සෘජු ආධාර ලබාදීම. | 12.250 | 12.063 | |
| කොමඩ් ලබාදීම | | | කොමඩ් ලබාදීම - 213 |
| ජල මෙට්ට ලබාදීම | | | ජල මෙට්ට ලබාදීම - 32 |
| වායු මෙට්ට ලබාදීම | | | වායු මෙට්ට ලබාදීම - 25 |
| ප්‍රවේශ මාර්ග පහසුකම් පැයයීම | | | ප්‍රවේශ මාර්ග පහසුකම් සැපයීම - 12 |
| ජල පහසුකම් ලබාදීම | | | ජල පහසුකම් ලබාදීම - 12 |
| විදුලි පහසුකම් ලබා දීම | | | විදුලි පහසුකම් ලබා දීම |
| ආබාධිත ප්‍රජාව සඳහා ලබා දුන් වෙනත් සේවා | | | |
| බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ව්‍යාප්තව ඇති සියළුම ස්වශක්ති සංවිධාන ඇගයීමේ වැඩ සටහන. | | | ස්වශක්ති සංවිධාන 331 ක් ඇගයීම. |
| රෝහල්වලට අනුයුක්ත කරන ලද ක්ෂේත්‍ර නිලධාරින් සඳහා වූ පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම. | | | පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම. |
| සී.බී. ආර්. අත්පොත මුද්‍රණය කිරිම. | | | පිටපත් 750 ක් මුද්‍රණය කිරීම. |
| දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු පාඨමාලාව පිළිබඳව ආබාධිත ප්‍රජාව දැනුවත් කිරිම. | | | වැඩසටසටහන් 12ක් පැවැත්වීම. |
| සී.බී.ආර් . සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීම - අමුණුකුඹුර | | | සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම. |
| විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ක්ෂේත්‍ර පරික්ෂණ | | | රැස්වීම් 20 ක් පැවැත්වීම. |

### 4.3.3.3 පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ප්‍රගතිය |
| අබාධිත ප්‍රජාව සඳහා වූ සුබසාධන වැඩසටහන | | | |
| මහරගම, නාවින්න මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ගේ පැමිණීමේ දීමනා ගෙවීම.<br>චිකිත්සකවරුන් සඳහා දීමනා ගෙවීම. (කථන/ භෞත/ වෘත්තීය ) | 1.500 | 1.178 | විශේෂ අවශ්‍යතා ඇති ළමුන් 99 ක් සඳහා දීමනා ගෙවීම<br><br>චිකිත්සකවරුන් දෙදෙනෙකු සඳහා දීමනා |
| ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබා දීම. (අමුද්‍රව්‍ය/ උපදේශක පුහුණු දීමනා /අධ්‍යාපන චාරිකා/ ක්‍රීඩා හා උත්සව ඇතුලත්ව) | 50.300 | 33.169 | අභ්‍යාසලාභීන් 412 ක් පුහුණු කිරීම |
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා වෘත්තීය පුහුණු ආයතන 10ක අභ්‍යාසලාභී දීමනා ගෙවීම | | | අභ්‍යාසලාභීන් 138 ක් පුහුණු කිරීම |
| පුහුණුව නිමකළ ආබාධිත තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා උපකරණ කට්ටල ලබාදීම. | 5.500 | 2.830 | අභ්‍යාසලාභීන් 99ක් සඳහා රු.15,000/- ක් වටිනා මෙවලම් කට්ටල ලබාදීම .<br>අභ්‍යාසලාභීන් 52 ක් සඳහා මහන මැෂින් ලබා දීම. |
| දෙපාර්තමේන්තුව යටතේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා සංවිධානවල නඩත්තු හා යටොගත්‍යාධාර ලබාදීම. | 0.100 | 0.100 | ස්වේච්ඡා සංවිධාන දෙකක් සඳහා නඩත්තු හා යටොගත්‍යාධාර ලබාදීම.<br>ස්වර්ණදාම පදනම රු. 60,000.00<br>බිහිරි සේවා පදනම රු.40,000.00 |
| පෙරපාසැල් ගුරුවරු 10 ක් සඳහා මාසකට රු. 5000.00 බැගින් දීමනාවක් ගෙවීම | 0.600 | 0.600 | වීරකැටිය අරුණැල්ල විශේෂ පාසැල ගුරුවරු -02<br>හ/කටුවන ප්‍රාථමික විද්‍යාලය ගුරුවරු - 01<br>හ/රිටිගහයාය මහා විද්‍යාලය ගුරුවරු -01<br>බඩල්කුඹුර ලිටිල් ෆලවර්ස් ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය ගුරුවරු - 03<br>නුවරඑළිය වොල්ට්‍රිම් කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය ගුරුවරු - 03 |
| එකතුව | 58.000 | 37.877 | |

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | **භෞතික ප්‍රගතිය** |
| ආශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල | | | |
| ක්‍රීඩා ආධාර ලබා දීම. | 0.200 | 0.190 | ආසියාතික වෙස් තරගයට සහභාගි වූ ආශ්‍යාබාධිතයින් 03ක් හා ආශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම ඇගයීම වෙනුවෙන් (කණ්ඩායම් 20)ක් සඳහා ගෙවීම් කිරීම . |
| වෘත්තීය පුහුණු දීමනා ගෙවීම. | 0.200 | 0.290 | වෘත්තීය පුහුණු උපදේශකවරු 06ක් සඳහා දීමනා ලබා දීම. |
| අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබා දීම. | 3.500 | 3.700 | ආශ්‍යාබාධිත විශ්ව විද්‍යාල , උසස් පෙළ සිසුන් හා ආශ්‍යාබාධිත දෙමාපියන්ගේ දරුවන් ඇතුලු 355ක් සඳහා අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ගෙවීම.<br>ආශ්‍යාබාධිත පුරවැසි පෙරමුණ බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරන කාලය සඟරාව සඳහා ගෙවීම් කිරීම.<br>2017 සුදු සැරයටි දින සැමරුම් උලෙළේ දී පලමු වසර විශ්ව විද්‍යාල සිසුන් 31ක් සඳහා අධ්‍යාපන ආධාර, කලාකරුවන් 06ක් හා ශ්‍රී ලංකාවේ එකම ආශ්‍යාබාධිත සංගීත කණ්ඩායමේ 06ක් සඳහා සංස්කෘතික ආධාර ලබා දීම.<br>2016 උසස් පෙළ විශිෂ්ට ලෙස සමත් සිසුන් 05ක් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම. |
| පුනරුත්ථාපන ආධාර ලබාදීම | 0.420 | 1.300 | අන්ධ ජන සේවා මණ්ඩලය උපදේශක වරුන් 07ක් , පුහුණු ලාභීන් 16ක් සඳහා දීමනා ගෙවීම.<br>මහමීගස්සැගම වෘත්තීය පුහුණු ආයතනයේ නේවාසිකාගාර අලුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන ලබාදීම. |
| අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම. | 0.800 | 0.170 | පුද්ගලයින් 17ක් සඳහා අක්ෂි කාච ලබාදීම. |
| ආශ්‍යාබාධිත කාන්තා සුබසාධන මධ්‍යස්ථානය | 0.520 | 0.250 | උපදේශක -01<br>සහයිකා -01<br>ආශ්‍යාබාධිත සිසුන් 05 |
| වෙනත් | 1.360 | 1.100 | (විගණන ගාස්තු, මූල්‍ය වියදම්, විවිධ වියදම් ) |
| එකතුව | 7.00 | 7.00 | |

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | භෞතික |
| මත් නිවාරණය හා පුනරුත්ථාපන වැඩසටහන | | | |
| 01. මත් නිවාරණය හා පුනරුත්ථාපන වැඩසටහන | 2.00 | 1.792 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24 ක තෝරාගත් ග්‍රාම නිලධාරී වසමක් පදනම් කරගෙන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br><br>වීදි නාට්‍ය පැවැත්වීම<br>පවුල් සංවර්ධන වැඩසටහන් පැවැත්වීම<br>පාසැල්වල අවදානම් කණ්ඩායම් දැනුවත් කිරීම අධ්‍යාපන වැඩසටහන් |
| 02. මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා වෘත්තීය පුහුණුව ලබා දීම. | - | - | පුනරුත්ථාපනය හා මත් නිවාරණය වූ සංඛ්‍යාව - 90 |
| එකතුව | 2.00 | 1.792 | |

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | භෞතික |
| දෙපාර්තමේන්තුව යටතේ පුහුණුව ලබන ආබාධ සහිත දරුදැරියන් සඳහා 2017අප්‍රේල් 28 වන දින අළුත් අවුරුදු උත්සවයක් බත්තරමුල්ල ජී.එච්. බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී පැවත්වීම. | 1.100 | 1.272 | ජන ක්‍රීඩා, ජන ගායනා හා අළුත් අවුරුදු සිරිත් විරිත් පිළිබඳ සංස්කෘතික වැඩසටහන් තුළින් අභ්‍යාසලාභීන් 412 දෙනෙකුගේ ආගමික හා ජාතීන් වශයෙන් අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කිරීම. |
| ආබාධ සහිත දරු දැරියන්ගේ "සිත්රූ 2017" - ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය 2017 ඔක්තෝම්බර් 02 වන දින පැවැත්වීම. | 5.000 | 4.930 | දිස්ත්‍රික් මට්ටමින් ආබාධ සහිත තරුණ තරුණියන් 270 දෙනෙකුගේ සහජ කලා කුසලතාවන් කලඑළි ගැන්වීම හා සම්මාන සහතික හා ත්‍යාග ලබා දීම. |
| ආබාධ සහිත දරු දැරියන්ගේ "2017 ජාතික ක්‍රීඩා තරඟය 2017 " නොවැම්බර් 17වන දින මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ දී පැවැත්වීම. | 9.900 | 9.200 | දිස්ත්‍රික් මට්ටමින් ආබාධ සහිත තරුණ තරුණියන්ගේ මලල ක්‍රීඩා තරග පවත්වා ත්‍යාග සම්මාන හා සහතික ලබා දීම සඳහා ප්‍රතිපාදන ලබා දීම.<br>ජාතික මට්ටමින් ආබාධ සහිත තරුණ තරුණියන් 580 දෙනෙකුගේ ජාතික මලල ක්‍රීඩා තරගය පවත්වා සම්මාන සහතික හා ත්‍යාග ලබා දීම. |

## 4.3.4 අත්කරගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- පූර්ව ළමාවියේ දීම ඇතිවන ආබාධිත තත්ත්වයන් අවම කිරීම මගින් පවුල් පරිසරය හා ආර්ථිකය ශක්තිමත් වීම.
- විධිමත්ව වෘත්තීය පුහුණුව නිමකළ ආබාධ සහිත තරුණ තරුණියන් සමාජ ගතවීම හා ජාතික ආර්ථිකයට දායක වීම.
- ආර්ථිකමය වශයෙන් ස්වයං රැකියා සඳහා යොමුවීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සනීපාරක්ෂක, නිවාස, ප්‍රවේශ හා සාමාජීය ගැටළු අවම වීම.
- බුද්ධි ඌණතා දරුවන් සඳහා රැකවරණය ලැබීම මගින් පවුල් පරිසරය තුළ ඇතිවන ගැටළු අවම වීම හා ආර්ථිකය ශක්තිමත් වීම.
- මතට ඇබ්බැහි වූවන් පූර්ණ නිවාරණයට පත්ව සමාජගත වීම හා අවදානම් කණ්ඩායම් දැනුවත් කිරීම තුළ සමාජ ආර්ථික හා සංස්කෘතික සංවර්ධනයක් පවුල් පරිසරය තුළ නිර්මාණය වීම.

## 4.3.5 ජයග්‍රහණ

- නව ආර්ථික වැඩ පිළිවෙල යටතේ ආවාසි සහගත ජන කොටස්වල සුබසාධනය පෙරදැරි කොට ගෙන සමාජ වෙළඳපොල ආර්ථිකය නැංවීම.
- බිම් මට්ටමේ හා ජාතික මට්ටම අතර ජීවත්වන අවාසි සහගත සියලුම ප්‍රජාවගේ ආදායම අතින් හෝ ජීවන මට්ටම අතින් හෝ විෂමතාවයක් නොපැවැතීම උදෙසා ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්විම .

ආබාධිත දරු දැරියන්ගේ
සංස්කෘතික කලා උළෙල -2017







## ආබාධිත දරුදැරියන්ගේ ජාතික මලල ක්‍රීඩා තරග - 2017







## ආබාධිත තරුණ තරුණියන්ගේ වෘත්තීය පුහුණුවීම්





## ජාතික සුදුසැරයටි සුරක්ෂා දිනය - 2017




## මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය



05

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව



# 05. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

## 5.1 හැඳින්වීම

2013 අංක 01 දරණ සමෘද්ධි පනතින් ස්ථාපිත මෙම ආයතනයට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ, දිළිඳු පවුල් ලක්ෂ 14 ට සමෘද්ධි සුබසාධනය සලසමින්, සමාජ ආරක්ෂණ අරමුදල මගින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවලදී ආරක්ෂණය සැලසීමට අදාලව දීමනා ලබාදෙමින්, ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබල ගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාල වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1,074ක් මගින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍ය කරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීමයි.මීට අමතරව, දිළිඳු පවුල් සහ අඩු ආදායම් ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමත්, සමාජ සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්ය.

## 5.2 කාර්යයන්

1. පුද්ගලයන්ගේ, පවුල්වල, කණ්ඩායම්වල සහ ප්‍රජාවගේ ආදායම් උත්පාදනය ඉහළ නංවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ එම ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම.
2. සමෘද්ධි ප්‍රතිලාභින්ගේ රැකියා අවස්ථා වැඩි කිරීම සඳහා සහය වීම.
3. අලෙවිකරණ කටයුතු වැඩි දියුණු කිරීම.
4. ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම.
5. පරිසර හිතකාමි ජීවන රටාවක් සඳහා මහජනතාව උනන්දු කරවීම.
6. පුද්ගල, පවුල්, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍රකරගත් සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය සඳහා අවශ්‍යවන සම්පත් සහ සේවා සපයනු ලබන ආයතන සමග සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.
7. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ පුරුදු වර්ධනය කිරීම සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හරහා විවිධ ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම
8. සම්පත් සහ සේවා වෙත ප්‍රවේශ වීමේ දී සමෘද්ධි ප්‍රතිලාභීන් මුහුණ දෙන බාධක ඉවත් කිරීම.
9. ප්‍රජාවගේ සුබසිද්ධිය සඳහා හිතකර වන, යුක්තිගරුක සමාජීය පරිසරයක් ඇතිකරන්නා වූ වැඩසටහන් දියත් කිරීම.
10. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආර්ථික දියුණුව සඳහා වන ව්‍යාපෘති සහ වැඩසටහන් සැලසුම් කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහභාගිත්වය ලබා ගැනීම.
11. ප්‍රජාමූල සංවිධාන පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කොට ඔවුන් ලවා දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කරගත් ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් සංවිධාන පිහිටුවා පවත්වාගෙන යාම .

## 5.3 කාර්ය සාධනය (2017.01.01 සිට 2017.12.31 දක්වා)

| කාර්යය | ප්‍රගතිය | ආයෝජනය (රු.මි.) |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් නිල කාමරයේ ප්‍රධාන දොරටුව නවීකරණය කිරීම. | ප්‍රධාන දොරටුව නවීකරණය කිරීම. | 0.05 |
| සංවර්ධන අංශවල කාර්යාල කාමර සැකසීම. | සංවර්ධන අංශ 8ක කාර්යාල කාමර සකස් කරන ලදී. | 1.70 |

### 5.3.1 මානව සම්පත් කළමනාකරණය

දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය |
|---|---|---|---|
| විෂයානුබද්ධ පුහුණුව සඳහා නිලධාරීන් යොමු කිරීම. | 4,231 | 2017.05.30 – 2017.11.01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානවලදි |
| රාජ්‍ය සේවය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම | 4,833 | 2017.06.01 – 2017.11.15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානවලදි |
| දේශීය අත්දැකීම් හුවමාරු වැඩසටහන්, විවෘත සංවාද වැඩසටහන්, ආකල්ප සංවර්ධන වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම | 401 | 2017.04.01 – 2017.10.30 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානවලදි |

## 5.3.2 භෞතික හා මූල්‍ය ප්‍රගතිය – 2017

### 5.3.2.1 වියදම් සාරාංශය

| වියදම් වර්ගය | මුළු ප්‍රතිපාදන (රු. මි) | වර්ෂයේ මුළු වියදම (රු.මි) |
|---|---|---|
| පුනරාවර්තන | 56,777.054 | 52,685.871 |
| ප්‍රාග්ධන | 1,236.700 | 1,179.344 |
| **එකතුව** | 58,013.754 | 53,865.216 |

### 5.3.2.2. ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන වැඩසටහන | 740.00 | 730.82 | *ජීවනෝපාය ව්‍යාපෘතීන් - 18,925<br>*ආදර්ශ ගම්මාන - 91/ ව්‍යාපෘතීන් - 9,031<br>*ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘති- 84 |
| අලෙවි සංවර්ධන වැඩසටහන | 169.00 | 144.33 | වැඩසටහන් 2,561 |
| සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන | 200.00 | 197.68 | වැඩසටහන් 4,747 / පුද්ගලයින් 310,706 |
| ප්‍රජාමූල සංවිධාන වැඩසටහන | 38.80 | 26.47 | ප්‍රජාමූල සංවිධාන 30,088 / ප්‍රාදේශීය සංවිධාන 331 / දිස්ත්‍රික් සංවිධාන 25 යි. |
| තොරතුරු තාක්ෂණ වැඩසටහන | 30.00 | 28.26 | *සමෘද්ධි ප්‍රතිලාභීන් තේරීමේ සමීක්ෂණයේ තොරතුරුවලට අනුව, නියම ප්‍රතිලාභීන් තේරීමේ නිර්ණායක ඇතුලත් මෘදුකාංගය සකස් කිරීම.<br>* නිලධාරීන් 1,074 ක් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම.<br>*ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල සඳහා පරිගණක උපකරණ හා අන්තර්ජාල පහසුකම් ලබා දීම. |
| සමෘද්ධි සහනාධාර සමීක්ෂණ වැඩසටහන | 6.40 | 6.40 | * අඩු ආදායම් ලාභීන් තේරීමේ සමීක්ෂණය යටතේ, ප්‍රතිලාභීන් මිලියන 2.31 කගේ තොරතුරු පරිගණක ගත කිරීම.<br>*තොරතුරු තාක්ෂණ අංශය හා ඒකාබද්ධව ප්‍රතිලාභීන් තේරීමේ නිර්ණායක ඇතුලත් මෘදුකාංගය සකස් කිරීම. |
| මාධ්‍ය වැඩසටහන | 11.20 | 11.16 | * සමෘද්ධි පුවත්පත් කලාප 24 ක් පළ කිරීම.<br>*රූපවාහිනී වැඩසටහන් 27 ප්‍රචාරය කිරීම<br>* ගුවන්විදුලි වැඩසටහන් 12 ප්‍රචාරය කිරීම<br>* මාධ්‍ය සන්නිවේදකයින් 125 ක් පුහුණු කිරීම |
| ප්‍රගති සමාලෝචන හා මෙහෙයුම් වැඩසටහන | 4.00 | 3.59 | ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන වැඩසටහන් 10 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන වැඩසටහන් 85 පවත්වන ලදි. |
| **එකතුව** | **1,200.00** | **1,148.71** | |

### 5.3.2.3 පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| සමෘද්ධි සහනාධාර වැඩසටහන | 43,950.00 | 39,707.05 | ප්‍රතිලාභීන් 1,388,242 |

## 5.3.3 අත්කරගත් සමාජ ආර්ථික ප්‍රතිඵල - 2017

- සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජීවන මට්ටම ඉහළ දැමීම සඳහා ,කෘෂිකාර්මික, සත්ත්ව පාලන, ධීවර, සුළු කර්මාන්ත සංවර්ධන හා රැකියා අභිමුඛ පුහුණුව ආදී විවිධ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් පවුල් 18,925 මාසික ආදායම රු5000/= කින් වර්ධනය වීම.
- වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම තුළින්, සමෘද්ධි ව්‍යවසායකින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා පුළුල් වීම.
- සමෘද්ධි නිෂ්පාදකයින්ගේ අතිරික්ත නිෂ්පාදන විධිමත් ලෙස ගබඩා කිරීමට පහසුකම් සැලසීම තුළින් ග්‍රාමීය වෙළඳපොළෙ හි මිල උච්ඡාවචනයන් අවම කිරීමට දායක වීම.
- අලෙවි මධ්‍යස්ථාන ඇති කිරීම හා ව්‍යවසායකත්ව පුහුණුව තුළින් අලෙවි ක්ෂේත්‍රයේ නව ස්වයං රැකියා අවස්ථා 100ක් ඇති වීම.
- දිස්ත්‍රික් මට්ටමින් ව්‍යවසායක සංගම් ඇති කිරීම තුළින් සමෘද්ධි ව්‍යවසායකයින් හට සාමූහිකව නැගී සිටීමට හැකි වීම.
- නිවාස වැඩසටහන් යටතේ, නිවාස 4,888 ක් ඉදිකිරීම තුළින්, දිළිඳු පවුල් 4,888 ගේ නිවාස අවශ්‍යතාවය සැපිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 954 ක්, ළමා සමාජ වැඩසටහන් 1,463 ක්, බොජුන් හල් 38 ක්, උපදේශන වැඩසටහන් 448 ක් සහ ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන් 579 ක් ක්‍රියාත්මක කිරීම තුළින්, සමෘද්ධි ප්‍රතිලාභීන් 269,948 ගේ සමාජ සංවර්ධනය වර්ධනය කිරීමට දායක වීම.
- පරිසර වැඩසටහන් යටතේ සමෘද්ධි හරිත උයන් 373 ක් ඇති කිරීම තුළින් වන ගහනය පැළ 100,000 කින් වර්ධනය වීම හා වන සංරක්ෂණය පිළිබඳව ප්‍රජාවගේ අවබෝධය පුළුල් වීම.
- සමෘද්ධි සහනාධාර දීමනාව මාසිකව ලබා දීම තුළින් දිළිඳු පවුල් 1,388,242 ගේ පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම.
- සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ, සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 251,524 කට උපත්, විවාහ, ලෙඩරෝග, මරණ හා ළමුන්ගේ අධ්‍යාපනය වැනි අවස්ථාවල දී මූල්‍ය ආධාර ලබාදීම තුළින් එම පවුල්වල සමාජ ආරක්ෂණය වර්ධනය වීම.
- සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,074 මඟින් රු.මි.42,258 ක ක්ෂුද්‍ර මූල්‍ය ණය 653,370 ක් ලබා දීම තුළින්, රටේ දළ දේශීය නිෂ්පාදිතයට ඉහත සැපයූ ණය මෙන් කිහිප ගුණයක දායකත්වයක් සැපයීම.

## 5.3.4 ජයග්‍රහණ - 2017

- ග්‍රාමීය ජනතාව ණය උගුලෙන් බේරා ගැනීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ "සමෘද්ධි අරුණළු" ක්ෂණික ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල බොජුන් හල් ඇති කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- සමෘද්ධි සහනාධාරලාභීන් නියමානුකූල කිරීම සඳහා, අඩු ආදායම්ලාභී පවුල් සමීක්ෂණය සිදු කිරීම.
- සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල නිවුන් දරු උපත් සඳහා විශේෂ සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- සමෘද්ධි ලොතරැයි වැඩසටහන යටතේ විශේෂ ආබාධිත තත්වයේ පසුවන පුද්ගලයින් සඳහා එක් අයෙකුට රු. 250,000/- බැගින් වන පරිදි නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- දිළිඳු පවුල් 1,388,242 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබාදී ඔවුන්ගේ පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම. (2017.01.01 සිට 2017.12.31 දක්වා ලබා දී ඇති සහනාධාරයන්හි මූල්‍ය වටිනාකම රු.මි. 39,707.05 වේ.)
- සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සමාජ ආරක්ෂණය වැඩිකිරීම සඳහා එම පවුල්වල දරු උපත් 6,369 ක් සඳහාත්, විවාහ 27,905 ක් සඳහාත්, ලෙඩ රෝග වැළඳුන පුද්ගලයින් 51,719 ක් සඳහාත්, මරණයට පත් පුද්ගලයින් 28,228 ක් සඳහාත්, ශිෂ්‍යත්ව 131,465 ක් සහ විශේෂ දරු උපත් 5,838 ක් වශයෙන් මුළු පවුල් 251,524 ක් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දී ඇති අතර, එහි මූල්‍ය වටිනාකම රු.මි. 1,054.43 ක් වේ.
- සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජීවන මට්ටම ඉහල දැමීම සඳහා කෘෂිකාර්මික ව්‍යාපෘති 4,816 ක්, සත්ව පාලන ව්‍යාපෘති 2,004 ක්, ධීවර සංවර්ධන ව්‍යාපෘති 363 ක්, සුළු කර්මාන්ත ව්‍යාපෘති 11,535 ක් සහ තරුණයින් සඳහා රැකියා අභිමුඛ පුහුණු වැඩසටහන් 207 ක් ක්‍රියාත්මක කර ප්‍රතිලාභි පවුල් 17,286 කට ප්‍රතිලාභ ලබා දෙන ලද අතර, මූල්‍ය වියදම රු.මි. 569.23 ක් වේ.
- සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 25 තුළ ගම්මාන 91 ක ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතීන් 9,018 ක් ක්‍රියාත්මක කරන ලද අතර, නිවාස 13 ක් ඉදිකරන ලදී. ඒ තුළින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව 9,031 ක් වේ. මූල්‍ය වටිනාකම රු.මි. 350.03 කි.
- දිරිය පියස නිවාස වැඩසටහන යටතේ, එක් අයෙකුට රු.150,000/- බැගින් වන පරිදි ප්‍රතිලාභීන් 892 ක් සඳහා නිවාස 892 ක් ඉදි කරන ලද අතර, මූල්‍ය වියදම රු.මි. 129.05 ක් වේ.
- කැකුළු ළමා සමාජ වැඩසටහන යටතේ, ළමයි 1,463 දෙනෙකු ජාතික මට්ටමේ සාහිත්‍ය හා සංස්කෘතික තරඟ සඳහා ඉදිරිපත් කිරීම තුළින් ඔවුන්ගේ දක්ෂතා ඇගයීම.
- දිස්ත්‍රික් මට්ටමේ ව්‍යවසායක සංගම් 23ක් ඇති කර ව්‍යවසායකයින් අතර අන්තර් සබඳතාවන් වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසීම. (මූල්‍ය වියදම රු.මි.0.49 ක් වේ).
- නිවාස ලොතරැයි වැඩසටහන යටතේ එක් අයෙකුට රු. 200,000 බැගින් වන පරිදි ප්‍රතිලාභීන් 3,972ක් සඳහා නිවාස 3,972ක් ඉදි කරන ලද අතර, මූල්‍ය වියදම රු.මි. 794.40 ක් වේ.
- විශේෂ ආබාධිත තත්වයේ පසුවන පුද්ගලයින් සඳහා එක් අයෙකුට රු250,000.00 බැගින් වන පරිදි , ප්‍රතිලාභීන් 24 දෙනෙකු සඳහා නිවාස 24 ක් ඉදි කරන ලද අතර, මූල්‍ය වියදම රු.මි. 6.0 ක් වේ.
- සමෘද්ධි ලොතරැයි අරමුදල යටතේ, සමෘද්ධි ආදර්ශ ගම්මානවල නිවාස 39 ක් වැඩි දියුණු කරන ලද අතර මූල්‍ය වටිනාකම රු.මි. 7.80 කි. විශේෂ නිවාස වැඩසටහන් යටතේ එක් අයෙකුට රු. 200,000 බැගින් වන පරිදි නිවාස 14 ක් ඉදි කරන ලදී. මූල්‍ය වටිනාකම රු.මි. 2.85 ක් වේ. මෙයට අමතරව, සමෘද්ධි නිවාස වාසනා ගම්මාන වැඩසටහන යටතේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස 26 ක් ඉදි කරන ලද අතර, මූල්‍ය වටිනාකම රු.මි. 13.00 ක් වේ.
- වන සනත්වය වැඩි කිරීම හා වන සංරක්ෂණය පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය පුළුල් කිරීම සඳහා හරිත උයන් ව්‍යාපෘති 373 ක් ක්‍රියාත්මක කල අතර ඒ වෙනුවෙන් වැය කල මුදල රු.මි. 14.82 ක් වේ.
- මත්ද්‍රව්‍ය භාවිතය වැනි අයහපත් ගති පැවතුම් නිසා පවුල් ඒකක මුහුණපාන ගැටළු අවම කර ඔවුන් තුළ සතුට හා සහජීවනය ගොඩ නැංවීම සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 954 ක් ක්‍රියාත්මක කර පවුල් ඒකක තුළ සතුට හා සමගිය වැඩි දියුණු කිරීම . (සිදු කරන ලද මූල්‍ය වියදම රු.මි. 14.81 ක් වේ.)
- ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ 2017 වර්ෂය තුළ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සඳහා ක්ෂුද්‍ර ණය 653,370 ක් සපයන ලද අතර, මූල්‍ය වටිනාකම රු.මි. 42,258.00 ක් වේ.
- විශේෂ ව්‍යාපාති සංවර්ධන වැඩසටහන යටතේ දේශිය පාරම්පරික කැඳ නිෂ්පාදනය, කොළ කැඳ හා සහල් පිටි ආශ්‍රිත කෑම වර්ග නිෂ්පාදනය, ගබඩා පහසුකම් සැපයීම, කුරුඳු වගාව, ගම්මිරිස් වගාව, කිතුල් පැණි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, බුලත් වගාව, පෙයාර්ස් වගාව, කිරිගව පාලනය, එළු පාලනය, කාබනික ගෙවතු වගාව ආදී ව්‍යාපෘතීන් 1,639 ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ තුළින් පවුල් 1,639 ක් ප්‍රතිලාභ ලබන ලදී. මූල්‍ය වියදම රු.මි. 21.20 කි.

- ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීම, බෝක්කු හා පැති බැමි ඉදිකිරීම, සුළු පරිමාණ ජල යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම ආදී ව්‍යාපෘතින් 84 ක් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර, එහි මූල්‍ය වටිනාකම රු.මි. 108.22 කි.
- දිස්ත්‍රික්ක මට්ටමින් සමෘද්ධි වෙළඳ ප්‍රදර්ශන 50 ක් පවත්වා සමෘද්ධි ව්‍යවසායකයින් 3,053 කට අධික පිරිසකගේ නිෂ්පාදන සඳහා වෙළඳපළ අවස්ථා උදාකිරීම.
- සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන 05 ක් පිහිටුවීම තුළින් සෘජු රැකියා 100 ක් ඇති වීම.
- සුළු පරිමාණ ව්‍යවසායකින් සඳහා අලෙවි අවස්ථා පහසු කිරීම පිණිස ජංගම රථ / කුටි 851 ක් සහ සුළු පරිමාණ යන්ත්‍ර සූත්‍ර 848 ක් ලබා දීම.
- ග්‍රාමීය වෙළඳ පොළ මිල උච්චාවචනයන් අවම කිරීම සඳහා ගෘහස්ථ මට්ටමේ ගබඩා පහසුකම් 108 ක් ඇති කිරීම.
- ව්‍යවසායක පුහුණු වැඩසටහන් 1,183 ක් තුළින් ව්‍යවසායකයින් 50,000 කට පමණ ව්‍යවසායක දැනුම ලබා දීම.
- දිවයින පුරා ප්‍රජාමූල සංවිධාන 30,088 ක්, ප්‍රාදේශීය සංවිධාන 331ක් සහ දිස්ත්‍රික් සංවිධාන 25ක් ඇති කිරීම තුළින් සමෘද්ධි ප්‍රතිලාභීන් සංවිධාන ගත කර සවිබල ගැන්වීම.

**අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනය - අම්පාර- කල්මුණේ**





**මැටි කර්මාන්තය - කොළඹ - කැස්බෑව ආදර්ශ ගම්මානය**





විසිතුරු මත්ස්‍ය වගාව– ගාල්ල - කඩවත් සතර





දිරිය පියස නිවාස වැඩසටහන - නුවරඑළිය
දිස්ත්‍රික්කය





සමෘද්ධි ශ්‍රම අභිමානි වෙළඳ ප්‍රදර්ශනය
මුලතිව් දිස්ත්‍රික්කය



සමෘද්ධි ශ්‍රම අභිමානි වෙළඳ ප්‍රදර්ශනය
ගම්පහ දිස්ත්‍රික්කය



ජීවනෝපාය ස්වයං රැකියා





සමෘද්ධි බෝජුන්හල - මොණරාගල- සියඹලාණ්ඩුව



කැකුළු ළමා සමාජ තරඟ - ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය



ග්‍රාමීය මාර්ග සංවර්ධනය - මහනුවර දිස්ත්‍රික්කය





06

# ආබාධ සහිත තැනැත්තන් සඳහා වන

# ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය



# 06. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය

## 6.1 හැදින්වීම

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය, වැඩිදියුණු කිරීම සහ සුරක්ෂිත කිරීම උදෙසා ඇති පනත යටතේ පනවා ඇති නීති රීති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනයයි.

## 6.2 කාර්යයන්

- ආබාධ සහිත තැනැත්තන් සඳහා සුහසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සුරක්ෂිත කිරීමට පියවර ගැනීම.
- ආබාධ ඇතිවීමේ ප්‍රධාන හේතු වැළැක්වීම හා පාලනය කිරීම සඳහා ඵලදායී පියවරයන් වර්ධනය කිරීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්වය පහසු කරලීමට අවශ්‍ය මූල්‍යාධාර සැපයීම හා උපදේශනාත්මක සේවාවන් ලබා දීමට පියවර ගැනීම.
- ආබාධ සහිත තැනැත්තන්ට යෝග්‍ය පරිදි භෞතික පරිසරය සැකසීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම සහ මාර්ගෝපදේශ ලබා දීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අදාළ නෛතික පසුබිම බලාත්මක කිරීමට අවශ්‍ය පියවර මුලාරම්භය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- තනි මාපිය පවුල් ආර්ථික, සමාජීය හා මානසික වශයෙන් ශක්තිමත් කිරීම.
- වකුගඩු රෝගීන්ගේ පවුල් සඳහා ආර්ථික සහය ලබා දීම.

## 6.3 කාර්ය සාධනය - 201701.01 සිට 2017.12.31 දක්වා

### 6.3.1 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

#### 6.3.1.1 වියදම් සාරාංශය

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 62.00 | 60.01 |

## 6.3.1.2 ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රතිපාදන රු.මි. | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| **01** | ආබාධ සහිත පුද්ගලයන් සඳහා සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | | |
| **1.1** | ආබාධ සහිත පුද්ගලයන් සඳහා ආධාරක උපකරණ ලබාදීම. | 13.20 | 13.137 | රෝද පුටු 232, කොමඩ් රෝද පුටු 41, අත්වාරු 112, කිහිළිකරු 57, ත්‍රෛසිකල් 10, වෝකර් 19, දුර හා ළඟ පෙනෙන ඇස් කණ්ණාඩි 639, ළඟ පමණක් පෙනෙන ඇස් කණ්ණාඩි 55723, විශේෂ ආධාරක උපකරණ 28, ශ්‍රවණ උපකරණ 14 |
| **1.2** | සැත්කම්, ඖෂධ ලබා ගැනීම, සායනවලට යාමට ගමන් වියදම් වශයෙන් වෛද්‍ය ආධාර ලබා දීම. | 7.40 | 7.338 | ප්‍රතිලාභීන් 492 |
| **1.3** | පාසල් උපකරණ, සපත්තු, බෑග් ලබා ගැනීම සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම | 3.60 | 3.591 | ප්‍රතිලාභී දරුවන් 527 |
| **1.4** | රාජයේ නිලධාරීන් සඳහා සංඥා භාෂාව, බ්‍රේල් විද්‍යාව චලතාවය හා දිශානතිය, පුහුණු වැඩසටහන් පැවැත් වීම. | 0.17 | 0.16 | වැඩසටහන් 2 කි. සහභාගී වූ සංඛ්‍යාව 50 |
| **1.5** | ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම. | 10.00 | 9.98 | පුද්ගලයින් 422 |
| **1.6** | ආබාධ සහිත තැනැත්තන්ගේ දක්ෂතාවයන් වැඩි දියුණු කර ගැනීම සඳහා ආධාර ලබා දීම. | 0.76 | 0.735 | පුද්ගලයින් 16 |
| **1.7** | ආබාධ සහිත තැනැත්තන් රැකබලා ගන්නා සංවිධාන වැඩි දියුණු කිරීම සඳහා ආධාර ලබා දීම. | 1.85 | 0.818 | සංවිධාන 4 ක් සඳහා ආධාර ලබා දීම. |
| **1.8** | ජාත්‍යන්තර ආබාධිත දිනය සැමරීම. | 3.77 | 3.136 | |
| **1.9** | ප්‍රකාශන හා මාධ්‍ය කටයුතු | 0.15 | 0.14 | |
| **1.10** | පරිපාලන වියදම් | 1.1 | 0.973 | |
| **02** | තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහන | | | |
| **2.1** | මව හෝ පියා පමණක් සිටින පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම. | 17.00 | 17.00 | තනි මාපිය පවුල් 702 සඳහා |
| **2.2** | තනි මාපිය පවුල්වල දරුවන් කියවීමට හුරු කරවීම සඳහා කියවීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම. | 3.00 | 3.00 | කියවීමේ මධ්‍යස්ථාන 27 ක් ආරම්භ කිරීම. |
| **එකතුව** | | 62.00 | 60.01 | |

### 6.3.1.3 පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන රු.මි. | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| මසකට රු. 5000/- බැගින් කාලික වකුගඩු රෝගීන් (CKDu) සඳහා දීමනා ලබා දීම. | 907.22 | 868.761 | පුද්ගලයින් 20,424 |
| ආබාධ සහිත පුද්ගලයන් සඳහා මසකට රු. 3000/- ජීවනාධාර ලබා දීම. | 1103.529 | 1103.529 | පුද්ගලයින් 30,654 |
| වික්ටෝරියා නිවාසයේ නඩත්තු සඳහා ආධාර ලබා දීම. | 9.00 | 9.00 | ආබාධිත පුද්ගලයින් 165<br>කාර්ය මණ්ඩලය 84<br>විදුලිය, ජලය හා කාර්යාල නඩත්තුව සඳහා |
| එකතුව | 2,019.749 | 1,981.29 | |

### 6.3.1.4 වෙනත් ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද සංවර්ධන වැඩසටහන් (සුපිරි වාසනා ලොතරැයි ආදායමෙන් ලැබෙන ප්‍රතිපාදන)

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන රු.මි. | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි.) | භෞතික |
| ආබාධ සහිත පුද්ගලයන්ට නිවසක් ඉදි කර ගැනීම හෝ නිවස අලුත් වැඩියා කිරීම සඳහා ආධාර ලබා දීම. | 50.00<br>(ලැබීමට අපේක්ෂා කල මුදල) | 37.80 | I වාරික 89<br>II වාරික 257<br>III වාරික 131<br>එකතුව 477 |

## 6.3.2 ළඟා කරගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- ආබාධ සහිත තැනැත්තන්ට ස්වාධීනව තම ජීවන තත්වය වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව ලැබීම.
- ආබාධ සහිත ප්‍රජාව සාමාජීය වශයෙන් අන්තර්කරණය වීමට අවස්ථා ලැබීම.
- ආබාධ සහිත පුද්ගලයින් සමාජානුකරණය වීම සඳහා අවස්ථාව ලැබීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා වීම.
- වකුගඩු රෝගීන්ගේ පවුල්වල ආර්ථික තත්වය පසුබෑම අවම කිරීමට හැකිවීම.
- තනි මාපිය පවුල් ආර්ථික, සමාජීය සහ මානසික වශයෙනුන් ශක්තිමත් කිරීමට හැකිවීම.

## 6.3.3 ජයග්‍රහණ

- ආබාධ සහිත පුද්ගලයින් 422 හට ජීවන තත්වය වැඩි දියුණු කර ගැනීමට හැකිවීම.
- ආබාධ පුද්ගලයින් 30,077 දෙනෙකු හට ස්වාධීනව කටයුතු කිරීමට හැකිවීම.
- ආබාධ සහිත පුද්ගලයින් 56,875 දෙනෙකුගේ ආබාධ සහිත තත්වය අවම කර ගැනීමට හැකිවීම.

- ආබාධ සහිත දරුවන් 527 දෙනෙකුගේ අධ්‍යාපන තත්වය දියුණු කිරීමට හැකිවීම.
- පුද්ගලයන් 492 දෙදෙනෙකු ආබාධිත තත්වයට පත්වීම වැළැක්වීමට හැකිවීම.
- ආබාධ සහිත පුද්ගලයන් 16 දෙනෙකුගේ දක්ෂතා වැඩි දියුණු කිරීමට හැකිවීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්වය උසස් කිරීම උදෙසා සංවිධාන 4 ක් වැඩි දියුණු කිරීමට හැකිවීම.
- ආබාධ සහිත පුද්ගලයන් සමඟ සන්නිවේදනය පහසු කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් 50 දෙනෙකු සඳහා බ්‍රේල් විද්‍යාව, සංඥා භාෂාව චලතාවය හා දිශානතිය පුහුණු වැඩසටහන් 2 ක් පැවැත්වීමට හැකිවීම.
- ආබාධ සහිත තැනැත්තන් 477 දෙනෙකු සඳහා සුරක්ෂිතව වාසය කිරීමේ අවස්ථාව ලබා දීම.
- වකුගඩු රෝගීන් 20,424 දෙනෙකුගේ ජීවන තත්වය උසස් කරවීමට හැකිවීම.
- තනි මාපිය පවුල් 702 ක ජීවන තත්වය උසස් කිරීම සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීමට හැකිවීම.
- තනි මාපිය පවුල්වල දරුවන්ගේ කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම සඳහා කියවීමේ මධ්‍යස්ථාන 27 ක් ආරම්භ කිරීමට හැකිවීම.
- ආබාධ සහිත තැනැත්තන්ගේ අභිමානවත් බව ප්‍රදර්ශනය වීමට හැකි පරිදි ආබාධ සහිත තැනැත්තන්ගේ ජාත්‍යන්තර දින ජාතික උත්සවය පැවැත්වීමට හැකිවීම.
- ප්‍රසිද්ධ ස්ථාන සඳහා ආබාධ සහිත පුද්ගලයන්ට ගමන් කිරීමට හැකිවීම සඳහා නෛතික පසුබිම ශක්තිමත් කිරීමට හැකිවීම.
- ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම ශක්තිමත් කිරීමට හැකිවීම.
- ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික දින උත්සවයට සමගාමීව නිවාස 10 ක් ඉදි කිරීම.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාත්‍යන්තර දින සැමරුම් උළෙළ 2017.12.03 දිවුලපිටිය - 5 වසර ශිෂ්‍යත්වය සමත් සිසුන් සඳහා මුදල් ත්‍යාගයක් ගරු අමාත්‍යතුමා අතින් ලබාදීම.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාත්‍යන්තර දින සැමරුම් උළෙලට සමගාමීව දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආබාධ සහිත තැනැත්තෙක් සඳහා ඉදිකර දුන් නව නිවස ගරු අමාත්‍යතුමා විසින් විවෘත කිරීම 2017.12.03 දිවුලපිටිය





ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාත්‍යන්තර දින සැමරුම් උලෙළ 2017.12.03 දිවුලපිටිය - උසස් පෙළ සමත් ශිෂ්‍යාව සඳහා මුදල් ත්‍යාගයක් අමාත්‍යාංශය ලේකම් තුමිය අතින් ලබා දීම.



තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහන යටතේ සත්ව පාලනය සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම. කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයය



ආබාධ සහිත පුද්ගලයින් සඳහා ඇඳුම් මසා අලෙවි කිරීම වෙනුවෙන් ස්වයං රැකියා ආධාර ලබාදීම. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයය



තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහයන යටතේ ඇඳුම් මසා අලෙවි කිරීම සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම. මාස්පත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයය



තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය යටතේ නිවාස ආධාර ලබා දීම මගින් අළුත්වැඩියා කරන ලද නිවස. වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයය



ආබාධ සහිත පුද්ගලයින් සඳහා නිවාස ආධාර ලබා දීම - කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයය



07

# වැඩිහිටි තැනැත්තන් සඳහා වන

# ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය



# 07. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය

## 7.1 හැඳින්වීම

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ හා සංවර්ධනය කිරීමේ සුවිශේෂී අවස්ථාවක් ලෙස 2011 අංක 9 දරණ පනතින් හා සංශෝධිත 2011 අංක 05 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවීම සිදු කර ඇත.

## 7.2 කාර්යයන්

- ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබල ගැන්වීම.
- වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.
- වැඩිහිටි විෂයට අදාළව ප්‍රකාශන පළ කිරීම.
- පුහුණු, පර්යේෂණ, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- වැඩිහිටි සාත්තු සත්කාරක සේවා පුහුණු වැඩසටහන පවත්වාගෙන යාම
- වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම.
- ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සවය පැවැත්වීම.
- වැඩිහිටි නිවාස නඩත්තු කටයුතු සිදු කිරීම.
- වැඩිහිටියන් සඳහා නඩත්තු මණ්ඩලය පවත්වාගෙන යාම.
- වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පැවැත්වීම.
- අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් රු. 2000 දීමනාව ගෙවීමට අදාළ කටයුතු සිදු කිරීම.
- වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන.
- වැඩිහිටි නිවාසවලට අදාළව ඉදිකිරීම් හා අලුත් වැඩියා කිරීම් සිදු කිරීම.
- නිලධාරීන්ගේ පුහුණු හා ධාරිතා සංවර්ධනය.

## 7.3 කාර්ය සාධනය - 2017.01.01 සිට 2017.12.31 දක්වා

### 7.3.1 භෞතික සම්පත් සංවර්ධනය

| කාර්යය | ප්‍රගතිය | ආයෝජනය (රු.මි) |
|---|---|---|
| කතරගම වැඩිහිටි නිවාසයේ පාලිකා නිල නිවස අලුත්වැඩියා කිරීම. | සිදු කිරීමට අපේක්ෂා කළ, පාලිකා නිල නිවසේ අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. | 0.1046 |
| මාලිගාතැන්න වැඩිහිටි නිවාසයේ වතුර ටැංකි රඳවනය ඉදි කිරීම් කටයුතු සිදු කිරීම. | වතුර ටැංකි රඳවනය ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත. | 0.2579 |

### 7.3.2 මානව සම්පත් කළමණාකරණය

#### 7.3.2.1 දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය |
|---|---|---|---|
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා 02 | නිළධාරීන් 02 | මාස 06 | ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| නායකත්ව පුහුණු වැඩසටහන | නිළධාරීන් 120 | දින 03 | කිතුල්ගල පුහුණු මධ්‍යස්ථානය |

### 7.3.3 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

#### 7.3.3.1 වියදම් සාරාංශය

| | ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| පුනරාවර්තන | 50 | 34.1405 |
| ප්‍රාග්ධන | 20 | 6.1491 |
| **එකතුව** | 70 | 40.2896 |

## 7.3.3.2 ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | භෞතික |
| ඉදිකිරීම් හා අළුත් වැඩියා කිරීම් | 2.000 | 1.3034 | කතරගම හා මාළිගාතැන්න වැඩිහිටි නිවාසවල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම |
| කාර්යාල උපකරණ මිළදි ගැනීම. | 1.000 | 0.8416 | ලිපිගොනු කබඩ් 23,රාක්ක 01, පරිගණක මේස 01 , පුටු 01 ,මේස 01 ,කබඩ් 01 |
| යන්ත්‍ර සූත්‍ර මිළදි ගැනීම | 13.000 | 0.1800 | ලැමිනේටින් යන්ත්‍ර -10 |
| පුහුණු හා ධාරිතා සංවර්ධනය | 4.000 | 3.8241 | 7.3.2.1 යටතේ විස්තර දක්වා ඇත. |
| **මුළු එකතුව** | **20.000** | **6.1491** | |

## 7.3.3.3පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | භෞතික |
| ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබල ගැන්වීම. | 1.500 | 1.4983 | ග්‍රාමීය වැඩිහිටි කමිටු - 229, ප්‍රාදේශී වැඩිහිටි කමිටු - 02, දිස්ත්‍රික් වැඩිහිටි කමිටු - 02, පළාත් මට්ටම - 01, ජාතික මට්ටමේ රැස්වීම් - 02, අත්දැකීම් හුවමාරු වැඩසටහන්- 01, ආගමික චාරිකා වැඩසටහන - 01 (පුත්තලම දිස්ත්‍රික්කය) |
| වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම | 0.551 | 0.4679 | නිකුත් කළ හැඳුනුම්පත් ගණන - 45,156 |
| ප්‍රකාශන | 3.000 | 1.6862 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා මුද්‍රිත බැනර් 25<br><br>වැඩිහිටියෝ සඟරාව - 1500 , ත්‍රෛමාසික පුවත්පත - 3000 (කලාප 3), සාර්ථක වැඩිහිටි දිවියට මඟ (අත්පොත) - 2500, වැඩිහිටි ස්වයං තොරතුරු වාර්තා අත්පොත - 6000 , 2015 හා 2016 වාර්ෂික වාර්තා පොත් හා සී. ඩී මුද්‍රණය කිරීම. |

| | | | |
|---|---|---|---|
| පුහුණු, පර්යේෂණ, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 8.575 | 3.9491 | ව්‍යායාම වැඩසටහන් 02, ව්‍යායාම පොත් 1000 හා ඩී.වී.ඩී 1000 , සංගීත උපදේශන වැඩසටහන් -10, කාන්තා දින සැමරුම් වැඩසටහන 01, මාධ්‍ය වැඩසටහන් 01, ජනගහනය හා තිරසාර සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය පැවැත්වීම., තිරසර ලංකා ප්‍රදර්ශනයට සහභාගීත්වය හා දැනුවත් කිරීම් සිදු කිරීම., පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 07 , විශ්‍රාම පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් 07, රාජ්‍ය ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් 01 , ස්ටිකර් ඇලවීම මඟින් සිදු කළ දැනුවත් කිරීම් 01, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර ප්‍රගති සමාලෝචන රැස්වීම් 03, දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර ප්‍රගති සමාලෝචන රැස්වීම් 02, දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 01, වැඩිහිටි සාත්තු සත්කාරක සේවා සම්මුඛ පරීක්ෂණ හා පුහුණු වැඩසටහන පැවැත්වීම. (NVQ 02 මට්ටම ) පුහුණු කරන ලද ප්‍රමාණය 17 කි. සාත්තු සත්කාරක සේවා ටී ෂර්ට් හා කැප් - 250 |
| වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම. | 10.000 | 0.7034 | වෛද්‍ය සායන 9 |
| ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සවය පැවැත්වීම | 16.000 | 16.3435 | ජාතික උත්සවය පැවැත්වීම හා එයට සමගාමීව ක්‍රියාකාරකම් සිදු කිරීම.<br>දෙටුවර අභිමන් ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව සමෘද්ධි ළමා සමාජ මට්ටමින් දරුවන් වෙනුවෙන් දැනුම මිනුම තරඟාවලියක් පැවැත්වීම.<br><br>අවුරුදු 100 ට වැඩි වැඩිහිටියන් හා අවුරුදු 75ට වැඩි හා වැඩිම දරුවන් පිරිසක් සිටින දෙමාපියන්ට උපහාර පිදීම.<br><br>"ආදරයයි කරුණාවයි- පුංචි අපේ වැඩිහිටියෝ" පාසල් දරුවන් අතර නිර්මාණාත්මක තරඟාවලියක් පැවැත්වීම හා ජයග්‍රාහකයන් ඇගයීමට සහතිකපත්‍ර හා ත්‍යාග ලබා දීම.<br>හොඳම වැඩිහිටි නිවාසය තේරීමේ තරඟයක් පැවැත්වීම. |
| වැඩිහිටි නිවාස නඩත්තු කටයුතු සිදු කිරීම. | 2.400 | 2.3731 | කතරගම හා මාළිගාතැන්න වැඩිහිටි නිවාසවල නඩත්තු වියදම් දැරීම.<br>කොටිකාම්බ වැඩිහිටි නිවාසයේ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.<br>මී මුත්තා වැඩිහිටි නිවාසයට උපකරණ ආධාර ලබා දීම.<br>දංකොටුව විද්‍යා බන්දු වැඩිහිටි නිවාසයට උපකරණ ආධාර ලබා දීම.<br>මතුගම වැත්තෑව වැඩිහිටි නිවාසයට උපකරණ ආධාර ලබා දීම. |

| | | | |
|---|---|---|---|
| | | | මහියාව වැඩිහිටි නිවාසයට උපකරණ ආධාර ලබා දීම.<br>මොණරාගල පිළිසරණ වැඩිහිටි නිවාසයට උපකරණ ආධාර ලබා දීම<br>දෙහිඕවිට වැඩිහිටි නිවාසයට උපකරණ ආධාර ලබා දීම<br>නාත්තණ්ඩිය ජ්‍යෙෂ්ඨ පුරවැසි බල මණ්ඩලයේ අතරුදවුම් මුදල නිදහස් කිරීම. |
| වැඩිහිටියන් සඳහා පවත්වන නඩත්තු මණ්ඩල සාමාජික දිමනා ගෙවීම | 1.156 | 1.0031 | රැස්වීම් 50 පවත්වා ඇති අතර පැමිණිලි 149 ක් ලැබී ඇති අතර ඉන් පැමිණිලි 69 විසඳා අවසන් කර ඇත. |
| වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභා සාමාජික දීමනා ගෙවීම. | 1.154 | 1.0489 | රැස්වීම් වාර 09ක් පවත්වා ඇත.<br>විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම. |
| අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ගෙවන රු. 2000 දිමනාව පරිපාලන වියදම් | 5.664 | 5.0669 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 සඳහා ලිපි ද්‍රව්‍ය වියදම් ලබා දීම.<br>ලෙජර් 1000 මුද්‍රණය කිරීම.<br>රු.2000 දීමනාව ගෙවීමට අදාළව සිදු කර ඇති පර්යේෂණයේ ගෙවීම් කටයුතු කිරීම.<br>සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් 03ක් පැවැත්වීම.<br>සියලු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විෂය කටයුතු සිදු කරන නිළධාරීන් හට රු.5000 බැගින් දීමනාව ලබා දීම. |
| **මුළු එකතුව** | **50.000** | **34.1405** | |

## 7.4.3 අත්කරගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- මුදල් ආධාර ලැබු වැඩිහිටි කමිටුවලට මුල්‍ය ආධාරයක් වශයෙන් උපකාරි වීම.
- හැඳුනුම්පත් 45,156 ලබා ගත් වැඩිහිටියන් හට වැඩිහිටි හැඳුනුම්පතට හිමි වරප්‍රසාද ලබා ගැනීමේ අවස්ථාව ලැබීම.
- වැඩිහිටි විෂයට අදාළව සිදු කරන ප්‍රකාශන මඟින් වැඩිහිටියන්ට තම අදහස් හා මතවාදයන් සමාජගත කිරීමේ අවස්ථාව ලැබීම හා විෂයට අදාළව දැනුවත්භාවය ලබා ගැනීමට අපේක්ෂා කරන සියලු දෙනාටම එමගින් අවස්ථාව ලැබීම.
- පුහුණු පර්යේෂණ හා දැනුවත්භාවයට අදාළව සිදු කරන දැනුවත් කිරීම් මගින් වැඩිහිටි විෂයට අදාළව දැනුවත්භාවය සමාජය තුළ වර්ධනය වීම.
- වැඩිහිටි සත්කාරක සේවා පුහුණු මගින් වෘත්තීමය දැනුමක් හිමි පිරිසකගේ සහය ලබා ගැනීමේ අවස්ථාව වැඩිහිටියන්ට ලැබීම හා එමඟින් රැකියා විරහිත පිරිසකට ආදායම් උත්පාදන ක්‍රමවේදයක් සකස් වීම.
- සමාජයේ සෞඛ්‍ය අවශ්‍යතා සහිත වැඩිහිටියන් පිරිසකට සිය නිරෝගිභාවය පවත්වාගෙන යාමේ හැකියාව ලැබීම.
- ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සවය පැවැත්වීම මගින් වැඩිහිටියන් ඇගයීම , වැඩිහිටියන්ට ඉදිරිපත්වීමේ අවස්ථාව ලැබීම හා වැඩිහිටිභාවයට අදාළව සාමාජයීය කතිකාවක් නිර්මාණය වීම.

- වැඩිහිටි නිවාස පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදු කිරීම යටතේ වැඩිහිටි නිවාසවලට ආධාර ලබා දීම මගින් එම වැඩිහිටි නිවාසවල නේවාසිකව සිටින වැඩිහිටියන්ට පහසුකම් ලැබීම හා වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීමේ වැයමට අවස්ථාව ලැබීම.
- නඩත්තු මණ්ඩල රැස්වීම් වාර 50ක් පවත්වා ඇති අතර එමගින් දරුවන්ගේ නොසැලකීම්වලට ලක්ව පැමිණිලි ඉදිරිපත් කළ දෙමාපියන් වෙනුවෙන් සාධාරණය ඉටු කරදීම.
- වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 41 දෙනෙකුට ආධාර ලබා ගැනීමට හැකිවීමෙන් අසරණභාවයට පත්ව සිටින ඔවුනට ජීවනාධාරයක් වශයෙන් උපකාරී වීම.
- අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් රු.2000 දීමනාව ගෙවීමට අදාළ පරිපාලන කටයුතු විධිමත්ව සිදු කිරීම මගින් දීමනාලාභී පිරිස් වෙත පහසුකම් ලැබීම.
- ධාරිතා සංවර්ධන වැඩසටහන් මගින් නිලධාරීන්ගේ කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම තුළින් රාජකාරී කටයුතුවල තත්ත්වය වර්ධනය වීම.

## 7.3.4 නව්‍යකරණ වැඩසටහන්

- නිලධාරීන් වෙනුවෙන් වෘද්ධ විද්‍යා ඩිප්ලෝමාව ආදි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව ලබා දීම.
- විදේශ පුහුණු සඳහා යොමු වීමේ අවස්ථාව නිලධාරීන් වෙත ලබා දීමෙන් නව දැනුම ලබා ගැනීමේ අවස්ථාව ලබා දීම.
- නායකත්ව පුහුණු අවස්ථා නිලධාරීන් වෙත ලබා දීම.

## 7.3.5 ජයග්‍රහණ

- වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු අවසන් අදියර දක්වා සිදු කිරීම.
- වැඩිහිටි කමිටු ව්‍යවස්ථාව සකස් කිරීම.
- වැඩිහිටි නිවාසවලට අදාළ ප්‍රමිතීන් සකස් කිරීම.
- වැඩිහිටි නිවාසයන්ට අදාළ නීති හා රෙගුලාසි සකස් කිරීම.
- අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 386,083 ක් වෙනුවෙන් මාසිකව රු.2000/- බැගින් ලබා දීමට හැකි වීම.

2017.01.02 දින සිදු කළ දානමය පිංකම





මීරිගම සෙත් සෙවන වැඩිහිටි නිවාසයේ
පැවති ව්‍යායාමය වැඩසටහන



ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ
නිලධාරීන්ගේ මූල්‍ය දායකත්වය ලබා
දීමෙන් ඉදිකළ නිවස හිමිකරු වෙත ලබාදීම



ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උළෙලට සමගාමීව පවත්වන
ලද දැනුම මිනුම තරගයේ අවසන් මහා තරගය







ජනගහනය හා තිරසාර සංවර්ධනය පිළිබඳ ආසියා පාර්ලිමේන්තු
මන්ත්‍රීවරුන්ගේ සංසදය ( AFPPD)












## ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සවය





## පොළොන්නරුව සීවලි මහා විද්‍යාලයේ දී පාසල් දරුවන් දැනුවත් කරමින්





කයිතඩි වැඩිහිටි නිවාසය වැඩිහිටියන් වෙනුවෙන් පවත්වන ලද උපදේශන වැඩසටහන



මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පවත්වන ලද උපදේශන වැඩසටහන



ධාරිතා සංවර්ධන වැඩසටහන - කිතුල්ගල





08

# ජාතික සමාජ සංවර්ධන ආයතනය



# 08. ජාතික සමාජ සංවර්ධන ආයතනය

## 8.1 හැදින්වීම

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍යය අධ්‍යාපන ආයතනය වේ. 1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇත.

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් කොළඹ ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීයව පිහිටුවා ඇති අනුරාධපුර, හම්බන්තොට, අම්පාර හා කිලිනොච්චිය යන සමාජ වැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් සමාජ වැඩ ශාස්ත්‍රපති, සමාජ වැඩ ශාස්ත්‍රවේදී, සමාජ වැඩ උසස් ඩිප්ලෝමා, සමාජ වැඩ ඩිප්ලෝමා හා උපදේශනය පිළිබද ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පාඨමාලා ද, කෙටිකාලීන අතුරු වෘත්තීය පුහුණු පාඨමාලා ද පවත්වාගෙන යනු ලැබේ. මීට අමතරව රාජ්‍ය ප්‍රතිපත්ති ගොඩනැංවීම සඳහා අවශ්‍ය කාලීන වශයෙන් වැදගත් පර්යේෂණ හා පුහුණු කටයුතු හඳුනාගෙන ඒවා ද ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාලක සභාව (Governing Council) ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (Academic Affairs Board) ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා වන උපදෙස් හා මග පෙන්වීම් ලබා දීම සිදු කරයි.

ආයතනයේ ක්‍රියාකාරී කටයුතු ප්‍රධාන එකිනෙකට බද්ධ වූ අංශ 4 කින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවා පහත පරිදි වේ.

- සමාජ සේවා විද්‍යාලය
- පුහුණු අංශය
- සමාජ සංවර්ධන, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
- පරිපාලන හා මුදල් අංශය

## 8.2 අරමුණු

- වෘත්තීය සමාජ වැඩ අධ්‍යාපනය, සමාජ සුභ සාධන කළමනාකරණය හා සමාජ සංවර්ධනය පිළිබඳ උසස් පාඨමාලා පැවැත්වීම, ප්‍රවර්ධනය හා ඒවා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මට්ටමකට ගෙන යාම.
- පුහුණු පාඨමාලා පුළුල් කිරීම, ශක්තිමත් කිරීම, සමාජ සුභ සාධනය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ වෙනත් ආයතන සමඟ සහයෝගීත්වයෙන් ඒවා පැවැත්වීම, අඩු වරප්‍රසාද භුක්ති විඳින ජන කොටස් සවිබල ගැන්වීම, මානව කුසලතා හා වෘත්තීය කුසලතා සංවර්ධනය තුලින් පුද්ගලයන්ට වඩා හොඳ ජීවන මට්ටමක් ලබා දීම.

- සමාජ වැඩ අධ්‍යාපනය, පුහුණුව හා සමාජ සුබසාධනය හා සංවර්ධනයට අදාල පර්යේෂණ කටයුතු කිරීම, ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම තුලින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුව සැලසීම.
- සමාජ සුභ සාධනය හා සමාජ සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂ දායකත්වය සැපයීම.
- ඉහත සියලුම අරමුණු සාර්ථකව ලගා කර ගැනීමට අවශ්‍ය වන මිනිස් බලය හා ජාතික සමාජ සංවර්ධන ආයතනයට ස්ථිර ගොඩනැගිලි සංකීර්ණයක් ස්ථාපනය කර ගැනීම වැනි යටිතල පහසුකම් ඇතුලු අනෙකුත් සම්පත් ලබා ගැනීම.

## 8.3 කාර්යයන්

- සමාජ වැඩ වෘත්තීයවේදී අධ්‍යාපනය ලබා දීම.
- සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම.
- සමාජ වැඩ සමාජ සුබසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන පළ කිරීම.
- සමාජ සුබසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
- සමාජ සුබසාධන කටයුතු වල නියැලී සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම.
- සමාජ සුබසාධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දීම.

## 8.4 ක්‍රියාත්මක වැඩසටහන්

- සමාජ වැඩ ඩිප්ලෝමා, සමාජ වැඩ උපාධි පාඨමාලා, අතුරු වෘත්තීය පාඨමාලා හා වෙනත් පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ක්ෂේත්‍ර වැඩ සම්බන්ධීකරණය
- සමාජ සුබසාධන හා සමාජ ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ කිරීම, පැවැත්වීම හා ක්‍රියාත්මක කිරීම.
- සමාජ වැඩ ප්‍රකාශන ග්‍රන්ථ හා පත්‍රිකා එළි දැක්වීම.
- සමාජ සුබසාධන කාර්යන්හි නියැලෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරීන්ගේ වෘත්තීමය කළමනාකරණ සංවර්ධනය කිරීම සඳහා විදේශීය හා දේශීය ආයතන වල මූල්‍ය පහසුකම් ඇතිව සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.
- ගරු ඇමතිතුමාට සමාජ සුබසාධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහාය වීම සඳහා එතුමාගේ සාකච්ඡා හා කාර්ය මණ්ඩල රැස්වීම් වලදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහය වීම සහ ඒ සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීම .
- රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ වල සමාජ සුබසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී සමාජ වැඩ සිසුන් එම ආයතන වලට ඔවුන්ගේ ව්‍යාපෘති මගින් අනුයුක්ත කිරීම, ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයීම, ඔවුන්ගේ සේවාවන් වඩාත් අර්ථවත් වීම පිණිස උපදේශන සේවා රැස්වීම් හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 8.5 කාර්ය සාධනය - 2017.01.01 සිට 2017.12.31 දක්වා

### 8.5.1 භෞතික සම්පත් සංවර්ධනය

| කාර්යය | ප්‍රතිපාදන (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|
| ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | 500.00 | 102.781 |

## 8.5.2 මානව සම්පත් කළමනාකරණය

### 8.5.2.1දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය |
|---|---|---|---|
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | 01 | 2016.05.05 හා 06 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| කලාපීය කළමනාකරණ සමුළුව - 2016 - AMDISA | 01 | 2016.07.25, 26 | සහතිකලත් වෘත්තීය කළමණාකරුවන්ගේ සංගමය |
| -විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ පුහුණුව | 02 | 2016.09.06 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| ගණකාධිකාරී කාර්ය භාරය ඩිජිටල්කරණය කිරීම පිළිබඳ සමුළුව 2016 | 02 | 2016.11.01, 02 | ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ සංගමය |
| Marking Teaching Effective (MATE Course) | 05 | 03 | කොළඹ විශ්ව විද්‍යාලයය |

## 8.5.3 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

### 8.5.3.1වියදම් සාරාංශය

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදන 2017 (රු.මි) | වියදම 2017 (රු.මි) |
|---|---|---|
| පුනරාවර්තන | 121.00 | 114.495 |
| ප්‍රාග්ධන | 11.00 | 10.400 |
| **එකතුව** | **132.00** | **124.895** |

## 8.5.4. ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

### 8.5.4.1 සමාජ සේවා විද්‍යාලය

| | වැඩසටහන | ශිෂ්‍ය සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|
| | සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව | | |
| 01 | 2012/2016 - ඉංග්‍රීසි මාධ්‍යය | 35 | 5,135,431.93 |
| 02 | 2013/2017 - ඉංග්‍රීසි මාධ්‍යය | 96 | |
| 03 | 2014/2018 - ඉංග්‍රීසි මාධ්‍යය | 112 | |
| 04 | 2015/2019 - ඉංග්‍රීසි මාධ්‍යය | 89 | |
| 05 | 2016/2017 - ඉංග්‍රීසි මාධ්‍යය | 32 | |
| 06 | 2017/2018 - ඉංග්‍රීසි මාධ්‍යය | 46 | |
| 07 | සංඥා භාෂා පරිවර්තක ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017 | 35 | 2,674,525.57 |
| 08 | සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව (සමාජ සේවා නිලධාරීන් සඳහා) රත්න මධ්‍යස්ථානය 2017/18 | 35 | 734,000.00 |

## 8. 5.4.2 පුහුණු අංශය

| අ.අ | ව්‍යාපෘතියේ නම | සහභාගීත්වය | පවත්වන / පැවැත්වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **01** | **උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** | | | |
| 1.1 | 2015/2017 සිංහල මාධ්‍යය | රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි නිලධාරීන් සහ අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තලාව | 55 |
| 1.2 | 2015/2017 දෙමළ මාධ්‍යය | | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර | 55 |
| 1.3 | 2015/2017 සිංහල මාධ්‍යය | | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර | 26 |
| 1.4 | 2016/2018 සිංහල මාධ්‍යය | පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරන ලද රාජ්‍ය නිලධාරීන් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම | 38 |
| 1.5 | 2015/2017 දෙමළ මාධ්‍යය | රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන්, උපාධි අපේක්ෂකයින් හා උසස් පෙළ සමත් සිසුන් | ග්‍රාම සංවර්ධන, පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, පිළිමතලාව | 35 |
| 1.6 | 2015/2017 (දෙමළ මාධ්‍යය) | | ඉප්ස් ශ්‍රී ලංකා ආයතනය, මඩකලපුව | 42 |
| 1.7 | 2015/2017 (දෙමළ මාධ්‍යය) | | පරිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, වව්නියාව | 45 |
| 1.8 | 2015/2017 (සිංහල මාධ්‍යය) - පළමු කණ්ඩායම | රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන්, උපාධි අපේක්ෂකයින් හා උසස් පෙළ සමත් සිසුන් | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 50 |
| 1.9 | 2015/2017 (සිංහල මාධ්‍යය) - දෙවන කණ්ඩායම | | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 43 |
| 1.10 | 2015/2017 (දෙමළ මාධ්‍යය) | | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 56 |
| 1.11 | 2016/2018 (සිංහල මාධ්‍යය) | | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 40 |
| 1.12 | 2017/2018 (දෙමළ මාධ්‍යය) | | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 40 |
| 1.13 | 2017/2018 (ඉංග්‍රීසි මාධ්‍යය) | | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 30 |
| 1.14 | 2017/2018 (සිංහල මාධ්‍යය) | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ඇති කණ්ඩායම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 25 |
| 1.15 | 2017/2018 (දෙමළ මාධ්‍යය) | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ඇති කණ්ඩායම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 20 |
| 1.16 | 2016/2018 (දෙමළ මාධ්‍යය) - ඒ කණ්ඩායම | | ඉප්ස් ශ්‍රී ලංකා ආයතනය, මඩකලපුව | 40 |
| 1.17 | 2016/2018 (දෙමළ මාධ්‍යය) - බී කණ්ඩායම | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, කලවංචිකුඩි | 40 |
| 1.18 | 2016/2018 (සිංහල මාධ්‍යය) | | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තලාව | 40 |

| | | | | |
|---|---|---|---|---|
| 1.19 | 2016/2018 (දෙමළ මාධ්‍යය) | රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන්, උපාධි අපේක්ෂකයින් හා උසස් පෙළ සමත් සිසුන් | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, කිලිනොච්චිය | 39 |
| 1.20 | 2017/2019 (දෙමළ මාධ්‍යය) | | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර | 45 |
| 1.21 | 2017/2019 (සිංහල මාධ්‍යය) | | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර | 17 |
| **02** | **ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** | | | |
| 2.1 | 2016/2018 (සිංහල මාධ්‍යය) | අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරන ලද ළමා රැකවරණ නිලධාරීන්, ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර | 40 |
| 2.2 | 2016/2018 (දෙමළ මාධ්‍යය) | කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරන ලද රාජ්‍ය නිලධාරීන් | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, කිලිනොච්චිය | 50 |
| 2.3 | 2016/2018 (සිංහල මාධ්‍යය) | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරන ලද රාජ්‍ය නිලධාරීන් | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තලාව | 38 |
| 2.4 | ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2016/2018 (සිංහල මාධ්‍යය) | මොණරාගල දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරන ලද රාජ්‍ය නිලධාරීන් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 32 |
| **03** | **වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** | | | |
| 3.1 | - 2015/2017 (සිංහල මාධ්‍යය) | වැඩිහිටි මහලේකම් කාර්යාලයට අනුයුක්ත වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් | ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තලාව | 43 |
| 3.2 | 2015/2017 (සිංහල මාධ්‍යය) | වැඩිහිටි මහලේකම් කාර්යාලයට අනුයුක්ත වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් | ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය, රන්න, හම්බන්තොට | 22 |
| **04** | **ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** | | | |
| 4.1 | 2016/2018 පළමු කණ්ඩායම | ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරීන් | ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව, බොරැල්ල | 44 |
| 4.2 | 2016/2018 - දෙවන කණ්ඩායම | ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරීන් | ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව, බොරැල්ල | 47 |
| 4.3 | 2016/2018 (දෙමළ මාධ්‍යය) | ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරීන් | ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව, බොරැල්ල | 17 |
| 05 | උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අරණායක | 46 |
| 06 | උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය යටතේ සේවයේ නියුක්ත නිලධාරීන් | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, රාජගිරිය | 80 |

මෙම පාඨමාලාවලට අමතරව විවිධ ආයතනයන්ගෙන් ලැබන ඉල්ලීම් අනුව කෙටි කාලීන පාඨමාලා 24 ක් පවත්වා ඇත.

## 8.5.4.3සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

| අ.අ | ව්‍යාපෘතියේ නම | ක්‍රියාකාරකම | ස්ථානය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු) | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|---|---|
| 01 | පුවත් හසුන | පුවත් හසුන මුද්‍රණය කර අවසන් කර ඇත. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | පුවත් හසුනෙහි පිටපත් 100ක් මුද්‍රණය කර අවසන් කර ඇත. | 39,800/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනෙකුත් අදාළ පිරිස්. |
| 02 | ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව 2017 | සමාජ වැඩ ජර්නලය මුද්‍රණය කර අවසන් කර ඇත. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | සමාජ වැඩ ජර්නලයේ පිටපත් 100 ක් මුද්‍රණය කර අවසන් කර ඇත. | 71,820/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනෙකුත් අදාළ පිරිස්. |
| 03 | වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය 2017 | වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය මුද්‍රණය කර අවසන් කර ඇත. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පිටපත් 100ක් මුද්‍රණය කර අවසන් කර ඇත. | 72,084/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනෙකුත් අදාළ පිරිස්. |
| 04 | ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සඟරාව 2017 | සමාජ සංවර්ධන සඟරාව මුද්‍රණය කර අවසන් කර ඇත. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | සමාජ සංවර්ධන සඟරාව පිටපත් 100 ක් මුද්‍රණය කර අවසන් කර ඇත. | 101,260/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනෙකුත් අදාළ පිරිස්. |
| 05 | වකුගඩු රෝගීන්ගේ පවුල් සඳහා සුබසාධනය පිළිබඳ සමීක්ෂණය | පර්යේෂණයට අදාලව වාර්තාව සකස්කිරීම | අනුරාධපුර දිස්ත්‍රික්කය හා පොළොන්-නරුව දිස්ත්‍රික්කය | ජනාධිපති ලේකම් කාර්යාලය හා සාකච්ඡා කර අවසන් සංශෝධන වලින් පසුව වාර්තාව අමාත්‍යාංශය වෙත භාර දීම | 2,061,097.21 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගී පවුල් |
| 06 | කාර්යමූල පර්යේෂණය | පර්යේෂණයේ අවසන් වාර්තාව සකස් කිරීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | පර්යේෂණ වාර්තා 100 ක් මුද්‍රණය කර අවසන් කර ඇත. | 61,760/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනෙකුත් අදාළ පිරිස්. |
| 07 | E-Journal | අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම හා මුද්‍රණය කිරීමට කටයුතු කිරීම. | ජාතික සමාජ සංවර්ධන ආයතනය | අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම හා සඟරා 20 ක් මුද්‍රණය කිරීම. | 51,500/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා රාජ්‍ය හා රාජ්‍ය නොවන අනෙකුත් අදාළ පිරිස්. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 08 | පුහුණු අංශයේ කාර්යභාර්ය | පර්යේෂණයේ අවසන් වාර්තාව සකස් කිරීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | පර්යේෂණ වාර්තා 100 ක් මුද්‍රණය කර අවසන් කර ඇත. | 48,000/- | අධ්‍යයන කාර්යය මණ්ඩලය හා රාජ්‍ය හා රාජ්‍ය නොවන අනෙකුත් අදාළ පිරිස් |
| 09 | "දිළිඳුකම අවම කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සමාජ වැඩ" පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය | ජාතික මට්ටමේ සම්මන්ත්‍රණය පැවැත්වීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 2017.12.13 හා 14 දෙදින පුරා ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී | 100,000/- | විශ්ව විද්‍යාල ආචාර්යවරු, ශිෂ්‍යයින්,අධ්‍යයන කාර්යය මණ්ඩලය හා රාජ්‍ය හා රාජ්‍ය නොවන අනෙකුත් අදාළ පිරිස් හා පර්යේෂණ අංශයේ නියතු අය |
| 10 | පුවත්පත් විශ්ලේෂණය | දිනපතා පළවන සිංහල පුවත්පත් වල පළවි ඇති සමාජ ප්‍රශ්න කිහිපයක් තේමා කරගනිමින් විශ්ලේෂණාත්මක වාර්තාවක් සකස් කිරීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | පර්යේෂණ වාර්තා 100 ක් මුද්‍රණය කර අවසන් කර ඇත. | 53,040/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනෙකුත් අදාළ පිරිස්. |
| 11 | ශාස්ත්‍රීය ග්‍රන්ථ ප්‍රකාශන එළිදැක්වීම | පර්යේෂණ අංශය මගින් ප්‍රකාශිත පර්යේෂණ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ප්‍රකාශන එළිදැක්වීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 2017.07.11 දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී | 41,738/- | ශිෂ්‍යයින්, පර්යේෂකයින් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
| 12 | කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළුව | පර්යේෂණ අංශයේ නිලධාරීන්ගේ වෘත්තීය දැනුම සංවර්ධනය කිරීම | ජාතික සමාජ සංවර්ධන ආයතනය | පර්යේෂණයකට අදාළ දත්ත හැසිරවීම සම්බන්ධ දේශකවරුන් සම්බන්ධ කර අදාළ වැඩමුළුව පැවැත්වීම හා සහභාගිවූවන්ට සහතිකපත්‍රයක් ලබාදීම | 60,276/- | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |

## 8.5.5 අත්කරගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- සමාජයේ විවිධ මට්ටම්වල රාජකාරී කටයුතු කළ හැකි සමාජ වැඩ වෘත්තිකයින් බිහිවීම හා රැකියා අවස්ථා උදාවීම.
- ගැටළු කළමනාකරණය තුළින් පුද්ගල ගැටළු සඳහා මැදිහත්විය හැකි උපදේශන වෘත්තිකයින් බිහිවීම හා රැකියා අවස්ථා උදාවීම තුළින් ඔවුන් සමාජ සංවර්ධනයට දායක කිරීම.

## 8.5.6 නව්‍යකරණ වැඩසටහන්

ආයතනයේ පැවති වෙබ් අඩවියේ අඩුපාඩු සකස් කරමින් නව වෙබ් අඩවියක් හඳුන්වාදීම.

## 8.5.7 ජයග්‍රහණ

- ✓ ජාතික හා අන්තර් ජාතික මට්ටමේ රැකියා සඳහා සමාජ වැඩ වෘත්තිකයින් යොමුවීම.
- ✓ ජාතික ආපදා අවස්ථාවන්වලදී මනෝසමාජීය මැදිහත්වීම - කොස්ගම ශාලාව පිපිරීම, අරණායක නාය යෑම, මීතොටමුල්ල කුණු කන්ද නායයාම, වැනි අවස්ථාවන්වලදී ආයතනයේ සිසුන් හා කාර්ය මණ්ඩලය එක්ව පුද්ගලයින් 15 බැගින් වූ කණ්ඩායම් 03 ක් අවශ්‍ය සුබසාධන කටයුතු සඳහා සහාය වීම.
- ✓ සීදූව නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්වීම මගින් පාඨමාලා රාශියක් ආරම්භ කර සමාජ වැඩ, උපදේශනය හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයන්ට කුසලතා සහිත වෘත්තිකයින් බිහි කිරීමේ අවස්ථාව උදාවීම.
- ✓ දේශීය පුහුණු සඳහා කාර්ය මණ්ඩලයේ 11 දෙනෙකු සහභාගී කරවීම මගින් වඩා ඵලදායීව කටයුතු කිරීමේ හැකියාව ලැබීම. (කෙටි කාලීන පුහුණුවීම් දින දෙකේ සිට දින දහය දක්වා)
- ✓ විදේශීය පුහුණු සඳහා කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු සහභාගී කරවීම තුළින් නව දැනුම හා අත්දැකීම් ආයතනික කටයුතු සඳහා යොදා ගැනීම.
- ✓ අභ්‍යන්තර උසස්වීම් 06 දෙනෙකු විසින් ලබාගත් අතර 11 දෙනෙකු අලුතින් බඳවා ගැනීම.
- ✓ ක්‍රියාකාරී සැලැස්මට අනුව අංශ 04 විසින් ඉලක්ක කොට තිබූ සියළු වැඩසටහන් නිමකිරීමට හැකි වීම.
- ✓ 2017 වර්ෂයේ **"දුගීකම තුරන් කිරීම හා තිරසාර සංවර්ධනය සඳහා සමාජ වැඩ"** යන මැයෙන් ජාතික සම්මේලනයක් පැවැත්වීම.

**ජාතික සම්මේලනය "දිළිදුකම අවම කිරීමේ හා තිරසාර සංවර්ධනය සඳහා සමාජ වැඩ" ජාතික සම්මන්ත්‍රණය - 2017**



**සීදූව නව ගොඩනැගිල්ලේ මුල්ගල් තැබීමේ උත්සවය - 2017.10.26**



ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2017.03.30



පර්යේෂණ අංශයේ ප්‍රකාශන එළිදැක්වීමේ උත්සවය




උපාධි ප්‍රධානෝත්සවය -2017.03.30



පුහුණු අංශය මගින් පාසල් සිසුන් සඳහා පවත්වන ලද පුහුණු සැසියක්



“දිළිඳුකම අවම කිරීම හා තිරසාර සංවර්ධනය සඳහා සමාජ වැඩ” ජාතික සම්මන්ත්‍රණය - 2017





උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ක්ෂේත්‍ර උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩමුළුව 2017



09

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය



# 09. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## 9.1 හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත සහ 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත මඟින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ස්ථාපිත කර ඇත.

## 9.2 කාර්යයන්

රජයේ විශ්‍රාම වැටුප් නොලබන ස්වයං රැකියා නියුක්තිකයින්, පුද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්, විදේශ සේවා නියුක්තිකයින්, කලාකරුවන් ආදී සෑම සේවා නියුක්තිකයින් වෙත ම විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්ය වේ.

## 9.3 කාර්ය සාධනය - 2017.1.01 සිට 2017.12.31 දක්වා

### 9.3.1 සාමාජිකයින් බඳවාගැනීම

| 2016.12.31 දක්වා එකතුව | | 2017.01.01 සිට 2017.12.31 දක්වා | | සමස්ත එකතුව | |
|---|---|---|---|---|---|
| සංඛ්‍යාව | මුල් වාරික මුදල රු.මි | සංඛ්‍යාව | මුල් වාරික රු.මි | සංඛ්‍යාව | මුල් වාරික මුදල රු.මි |
| 564,596 | 343.243 | 60,983 | 30.277 | 625,579 | 373.52 |

### 9.3.2 ප්‍රතිලාභ ගෙවීම

#### 9.3.2.1 විශ්‍රාම වැටුප් ගෙවීම

| 2016.12.31 දක්වා එකතුව | | 2017.01.01 සිට 2017.12.31 | | සමස්ත එකතුව | |
|---|---|---|---|---|---|
| සංඛ්‍යාව | වටිනාකම රු.මි | සංඛ්‍යාව | වටිනාකම රු.මි | සංඛ්‍යාව | වටිනාකම රු.මි |
| 25,263 | 1,045.06 | 27,080 | 262.217 | 52,343 | 1,307.277 |

### 9.3.2.2 පාරිතෝෂික ගෙවීම

| අ.අ | විස්තරය | 2016.12.31 දක්වා එකතුව | | 2017.01.01 සිට 2017.12.31 දක්වා එකතුව | | සමස්ත එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | වටිනාකම රු.මි | සංඛ්‍යාව | වටිනාකම රු.මි | සංඛ්‍යාව | වටිනාකම රු.මි |
| 01 | මරණ පාරිතෝෂික | 2,022 | 31.752 | 64 | 1.665 | 2,086 | 33.417 |
| 02 | පූර්ණ අබලතා පාරිතෝෂික | 32 | 0.962 | 03 | 0.102 | 35 | 1.065 |
| 03 | අර්ධ අබලතා පාරිතෝෂික | 67 | 1.054 | - | - | 67 | 1.054 |
| 04 | පූර්ණ අබලතා මාසික දීමනා | 27 | 5.092 | 27 | 0.627 | 27 | 5.72 |
| 05 | අතිරේක ප්‍රතිලාභ ගෙවීම | | | | | | |
| | • 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීම. | - | - | 172 | 1.804 | 172 | 1.804 |
| | • අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම. | - | - | 43 | 0.387 | 43 | 0.387 |

## 9.3.3 මානව සම්පත් කළමනාකරණය

### 9.3.3.1 දේශීය පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහන | සහභාගි වූ නිළධාරීන් සංඛ්‍යාව | පැවැත්වූ දිනය | ස්ථානය |
|---|---|---|---|---|
| 01 | ශක්‍යතා පුහුණු වැඩමුළුව | 75 | 2017.03.28 | ප්‍රධාන කාර්යාලය |
| 02 | කාර්යාල කාර්ය සහායක පුහුණුව | 6 | 2017.05.23 | ප්‍රාග් සර්විස් ප්‍රයිවට් ආයතනය |
| 03 | සේවාරම්භක පුහුණු වැඩමුළුව | 3 | 2017.05.29, 30,31 | නිපුණතා පියස |
| 04 | වාහන කළමනාකරණය | 1 | 2017.06.28 | ප්‍රාග් සර්විස් ප්‍රයිවට් ආයතනය |
| 05 | රාජ්‍ය සේවයේ විනය ක්‍රියා පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | 2017.06.27, 28 | DLC ආයතනය |
| 06 | රාජ්‍ය අංශයේ මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 2017.07.18/19 | DLC ආයතනය |
| 07 | උතුරු නැගෙනහිර පුහුණු වැඩසටහන | 22 | 2017.07.13/14 | යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 08 | ආයතනයක විනය පවත්වාගෙන යාමේ දී සේවකයාගේ යුතුකම් හා වගකීම | 11 | 2017.07.25 | ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |

| | | | | |
|---|---|---|---|---|
| 09 | වාහන කළමණාකරණය | 1 | 2017.08.11 දින සිට දින 20 ක් | ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| 11 | තොරතුරු පද්ධතිය විගණනය කිරීම පිළිබඳ වැඩසටහන | 2 | 2017.08.16/21 | දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රය |
| 12 | විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම | 5 | 2017.09.07 | ප්‍රාග් සර්විස් ප්‍රයිවට් ආයතනය |
| 13 | රියදුරන් සඳහා එක් දින වැඩමුළුව | 2 | 2017.09.21 | ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| 14 | වාර්ෂික ගබඩා සමීක්ෂණ හා පාවිච්චි කළ නොහැකි භාණ්ඩ අපහරණය | 3 | 2017.09.26 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| 15 | පෞද්ගලික ලිපිගොනුවක් එලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම | 1 | 2017.09.27 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| 16 | ආයතනික රාජකාරී කටයුතු සඳහා ස්නායු හා මනෝ විද්‍යාත්මක තත්ත්වය බලපාන ආකාරය පිළිබඳ වැඩමුළුව | 95 | 2017.12.29 | ප්‍රධාන කාර්යාලය |

## 9.3.4 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

### 9.3.4.1 වියදම් සාරාංශය

| වියදම් වර්ගය | ප්‍රතිපාදන රු.මි | වියදම රු.මි |
|---|---|---|
| පුනරාවර්තන | 113.50 | 119.30 |
| ප්‍රාග්ධන | 8.00 | 2.30 |
| **එකතුව** | **121.50** | **121.60** |

### 9.3.4.2 ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | 2017 ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (2017 දෙසැම්බර් 31 දක්වා) | |
|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි) | භෞතික |
| පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම | 0.45 | 0.447 | 100% |
| ස්ථාවර වත්කම් මිළ දී ගැනීම | 7.15 | 1.559 | 20% |
| පුහුණු හා වැඩමුළු | 0.40 | 0.398 | 99% |
| **එකතුව** | **8.00** | **2.404** | |

## 9.3.5 අත්කරගත් සමාජ ආර්ථීක ප්‍රතිඵල

- 50,917 දෙනෙකුගේ අනාගත දිවිය සඳහා මූල්‍ය රැකවරණයන් තහවුරු කිරීම.
- 27,080 දෙනෙකු සඳහා මාසිකව විශ්‍රාම වැටුපක් ලබා දීම.
- මිය ගිය 64 දෙනෙකු වෙනුවෙන් යැපෙන්නන් වෙත රු. 1,665,033.93 ක පාරිතෝෂික ගෙවීම් කිරීම.
- 27 දෙනෙකු සඳහා පූර්ණ අබලතා මාසික දීමනා ගෙවීම් කිරීම.
- 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් 172 දෙනෙකු වෙත සහ අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් දරුවන් 43 දෙනෙකු වෙත ප්‍රතිලාභ ලබා දීම.

## 9.3.6 ජයග්‍රහණ

- ඉලක්ක සපුරන ලද රාජ්‍ය නිලධාරීන් 208 දෙනෙකු ඇගයීම.
- කලාකරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මූලික තැන්පතු ලෙස රු. 50,000/- ක රජය මගින් ලබාදුන් මුදල ආයෝජනය කර විශ්‍රාම වැටුප ලබන අවස්ථාවේ දී මූලික තැන්පතුව හා ආයෝජන මුදල ලබා දීම තුළ වැඩි ආකර්ෂණයක් අපගේ විශ්‍රාම වැටුපට ලබාගැනීම.
- ඉහත ප්‍රතිලාභය බස්නාහිර පළාත් සභා කර්මාන්තකරුවන් වෙත රු. 10,000/= ලෙස රජය මගින් ලබා ගෙන ආයෝජනය කර ලබාදීමට යෝජිතව ඇත.

**සමාජ ආරක්ෂණ ජාතික සම්මාන උත්සවය - 2017**



### වැලිඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන





### යාපනය දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීම හා ප්‍රතිලාභ ලබා දීමේ වැඩසටහන





### ගාල්ල දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩමුළුව





**කළුතර දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන**





**සර්වෝදය එකොනොමික් එන්ටර්ප්‍රයිසස් ඩිවලොප්මන්ට් සර්විසස් (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම**

